# 2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්

## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂය - 253

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 1. | **ආයතනික පැතිකඩ** | **01 - 34** |
| 1.1. | හැදින්වීම | 01 |
| 1.2. | ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු | 02 -04 |
| 1.3. | ප්‍රධාන කාර්යයන් | 05 |
| 1.4. | සංවිධාන සටහන | 06 -07 |
| 1.5. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ | **08 - 22** |
| | I. පාලන අංශය | 08 - 10 |
| | II. සිවිල් විශ්‍රාම වැටුප් අංශය | 10 - 14 |
| | ▪ විමධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය | |
| | ▪ මධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය | |
| | ▪ ප්‍රතිපත්ති අංශය | |
| | III. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අංශය | 14 - 15 |
| | IV. ගිණුම් අංශය | 15 - 17 |
| | ▪ මාසික ගෙවීම් අංශය | |
| | ▪ පාරිතෝෂික අංශය | |
| | ▪ විෂමතා අංශය | |
| | ▪ වැන්දඹු අනත්දරු දායක මුදල් අංශය | |
| | ▪ සැපයුම් අංශය | |
| | ▪ වැඩිපුර ගෙවීම් අයකිරීම් අංශය | |
| | V. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල | 17 - 19 |
| | VI. අභ්‍යන්තර විගණන අංශය | 19 |
| | VII. නීති අංශය | 20 |
| | VIII. විදේශ විශ්‍රාම වැටුප් අංශය | 20 |
| | IX. සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් අංශය | 21 - 22 |
| | X. තොරතුරු තාක්ෂණ අංශය | 22 |
| | XI. මාධ්‍ය අංශය | 22 |
| | ➢ 2019 වර්ෂයේ කැපී පෙනෙන අවස්ථා | **23 - 27** |
| | ▪ නව හඳුන්වාදීම් | 23 - 26 |
| | • භෞතික වැඩිදියුණු කිරීම් | |
| | ▪ වාර්ෂික වැඩසටහන් | 26 - 27 |
| | • ජාතික විශ්‍රාමික දින සැමරුම | |
| | ➢ විශ්‍රාම වැටුප් ගෙවීම් (ප්‍රස්ථාර සහ වගු මගින්) | **28 - 34** |
| | ▪ වාර්ෂික විශ්‍රාමිකයින් සංඛ්‍යාව | 28 - 32 |
| | ▪ පාරිතෝෂික ගෙවීම් | 32 - 33 |
| | ▪ හිඟ වැටුප් ගෙවීම් | 33 - 34 |

| | | |
|---|---|---|
| **2.** | **ප්‍රගතිය හා ඉදිරි දැක්ම** | **35 - 38** |
| **3.** | **2019.12.31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය** | **39 - 81** |
| | 3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 39 |
| | 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 40 |
| | 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | 41 |
| | 3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් | 42 |
| | 3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය | 43 |
| | 3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය | 43 |
| | 3.7.මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 44 |
| | 3.9. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය | 44 |
| | 3.10. විගණකාධිපතිවරයාගේ වාර්තාව | 45 - 81 |
| **4.** | **කාර්ය සාධන දර්ශක** | **82 - 84** |
| | 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) | |
| **5.** | **මානව සම්පත් පැතිකඩ** | **85** |
| | 5.1.සේවක සංඛ්‍යා කළමනාකරණය | |
| | 5.2. මානව සම්පත් සංවර්ධනය | |
| **6.** | **අනුකූලතා වාර්තාව** | **86 - 93** |

### 1.1. හැඳින්වීම

වර්ෂ 1970 දෙසැම්බර් මස 23 වන දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ වන A ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස නිල වශයෙන් ස්ථාපිත කරන ලද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි මූලාරම්භය වර්ෂ 1900 පමණ දක්වා වූ දුරාතීතයකට විහිද යන්නකි. බ්‍රිතාන්‍ය යටත් විජිත අවධියේදී ශ්‍රී ලාංකීය රාජ්‍ය සේවකයින් හට හඳුන්වා දුන් දැවැන්ත සමාජ ආරක්ෂණ වැඩපිළිවෙලක් ලෙසින් හඳුනාගත හැකි මෙම රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප් ක්‍රමය රාජ්‍ය සේවකයෙකුගේ වියෝවෙන් පසු අසරණ භාවයට පත්වන වැන්දඹුව හා අනත් දරුවන්ගේ සිත්වල පහන් හැඟීමක් ඇති කරවන්නකි. 1898 වර්ෂයේ අංක 01 දරණ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත හා 1934 පෙබරවාරි මස 05 වන දින නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යන නෛතික ලියවිලිවලින් බැඳුනු රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය රජයේ නීතියක් ලෙස ස්ථාපිත විය.

1934 වර්ෂයේ සිට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයට වරින්වර සිදු කරන ලද සංශෝධනයන්ට හා 1972 මැයි මස 05 දින සිදු කරන ලද සංශෝධනයන්ට යටත්ව මෙම විශ්‍රාම වැටුප් ගෙවීම ක්‍රියාත්මක වේ. 1898 අංක 01 දරණ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත ද 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල් පනත ද ආබාධිත විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක වූ 1981 අංක 44 දරණ වැන්දඹු හා අනත්දරු සංශෝධිත පනත ද අනුව තවදුරටත් සේවාවන් හා ප්‍රතිලාභ පුළුල් කර ඇත. එමෙන්ම 1942 අංක 18 දරණ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත ප්‍රකාරව ක්‍රියාත්මක වන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල ද මීට සමගාමීව රාජ්‍ය සේවය සැපයූ පුරවැසියන් හට සහනය සලසයි.

2019 වසර අවසන් වන විට හය ලක්ෂ තිස්නව දහස් නවසිය අසූ හතරක විශ්‍රාමික ප්‍රජාවක් වෙනුවෙන් විශ්‍රාම වැටුප් ඇතුළු ප්‍රතිලාභ හිමිකර දෙමින් විශාල කාර්යභාරයක නිරත වන්නා වූ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව 2019 වර්ෂයේදී ආයතනික කළමනාකරණ ක්‍රියාවලිය තවදුරටත් විශ්‍රාමිකයා වෙත නැඹුරු කරවමින් ගුණාත්මකභාවය තීව්‍ර කිරීම සඳහා මධ්‍යගත දත්ත පද්ධතිය ඇතුළු ආයතනික ක්‍රියාවලිය සංවර්ධනය කිරීමට උපායමාර්ග රැසක් දියත් කරන ලදී.

ඒ අනුව වර්ෂ ගණනාවක් සිට අද දක්වාම ශ්‍රී ලංකා මාතෘ භූමිය වෙනුවෙන් සිය සේවය ලබා දුන් රාජ්‍ය සේවකයින්ගේත් රාජ්‍ය නිලධාරින්ගේ වියෝවීමෙන් අසරණ වන පවුලේ සාමාජිකයින්ට ආරක්ෂණය සැපයීම උදෙසා වන සේවාවන් නියමිත වේලාවට නිසි ලෙස සිදු කිරීමට ඇප කැප වන කාර්යය මණ්ඩලයක් සිටින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මාහැඟි සමාජ මෙහෙවරක යෙදෙන ආයතනයක් ලෙස හැඳින්විය හැක.

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

### දැක්ම

ආර්ථික හා සාමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක්

### මෙහෙවර

රාජ්‍ය සේවා විශ්‍රාමිකයන් හා ඔවුන්ගේ ප්‍රතිලාභීන් සඳහා තොරතුරු තාක්ෂණය හා තිරසාර කළමනාකරණ ක්‍රමවේද භාවිතයෙන් ද, පෞද්ගලික හා රාජ්‍ය අංශ මුහුවෙන් ඉහළ සේවාලාභී හා සේවාදායක තෘප්තිය තහවුරු කරමින් නෛතික ප්‍රතිලාභයන් පිළිගැන්වීම

# අරමුණු

- රාජ්‍ය සේවක විශ්‍රාම ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය හා වැන්දඹු හා අනත්දරු පනත හා වැන්දඹු පුරුෂ හා අනත්දරු පනතට අනුකූල වන පරිදි පිළිගැන්වීමේ ක්‍රියාවලිය නියාමනය කිරීම හා ඊට අදාල විධිවිධානයන් පැනවීම.
- විශ්‍රාම වැටුප් සම්බන්ධව නෛතික රාමු, රීතීන්ට හා ප්‍රතිපත්ති තීරණවලට අනුකූලව රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වැටුප පිළිගැන්වීම.
- මාසික විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අඛන්ඩව ගෙවීම හා එක්වරක් ගෙවන ප්‍රතිලාභ නිරවද්‍යතාවයකින් යුක්තව පිළිගැන්වීම.
- රා. සේ. අ. අ. ක්‍රමය නියාමනය හා ප්‍රතිලාභ පිළිගැන්වීම.
- රජය වෙනුවෙන් වැන්දඹු අනත්දරු දායක මුදල් රැස්කිරීම හා අනෙකුත් ආදායම් රැස්කිරීම හා කළමනාකරණය කිරීම.
- ත්‍රිවිධ හමුදාවට විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීම.
- සක්‍රීය සේවයේ යෙදී සිටියදී ජීවිතක්ෂයට හෝ දුබලතාවයට පත් වූ ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවා සාමාජිකයන්ට වන්දි වැටුප් හා දීමනා ගෙවීම.
- සමාජ ආරක්ෂණය පිළිබද ලෝක ප්‍රවණතා අධ්‍යයනය කරමින් නූතන සමාජ ආරක්ෂණ ක්‍රමයන් පිළිබදව ප්‍රතිපත්ති සම්පාදනය සදහා සහාය වීම.
- වාර්ෂික අයවැය පිළියෙල කිරීම හා ප්‍රගතිය පිළිබදව ව්‍යවස්ථාදායකයට වගවීම.
- ජාතික විශ්‍රාමික දින සැමරුම් උළෙල පැවැත්වීම.

- ✓ විශ්‍රාම වැටුප් ගෙවීමට අමතරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් පහත සේවාවන් සඳහා පහසුකම් සලසනු ලැබේ.

  - විශ්‍රාමිකයින් නැවත රැකියාගත කිරීම.
  - විශ්‍රාමිකයින් සඳහා දුම්රිය ස්ථානවලින් සෘජුවම නිදහස් ගමන් ප්‍රවේශ පත්‍ර වෙන් කරවා ගැනීමට පහසුකම් සැලසීම.
  - අන්තර් සම්බන්ධතා වැඩිදියුණු කිරීම සඳහා දුරකතන සහන පැකේජ් හඳුන්වා දීම.
  - විශ්‍රාමිකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා රක්ෂණ පහසුකම් සැපයීමට සහාය වීම.
  - දුරකථන App හරහා විශ්‍රාමිකයින්ට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ පහසුකම් සැපයීම.
  - විශ්‍රාම වැටුප් සකස් කිරීමේ ඒකක හා විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධ වන බැංකු හා ගෙවීම් ජාලය සමග ඵලදායි සම්බන්ධතාවයක් පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය.
  - සමස්ථ විශ්‍රාමික ප්‍රජාවගේ ආර්ථික හා සමාජ සුභසාධනයට අවශ්‍ය වැඩසටහන් හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීමට පෞද්ගලික හා රාජ්‍ය නොවන අංශයේ දායකත්වය ලබා ගැනීම.
  - විශ්‍රාමික සංගම් ප්‍රමුඛ කොටගත් සිවිල් සමාජය සක්‍රියව සම්බන්ධ කර ගනිමින් ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාවලියට දායක කර ගැනීම.
  - පරපුරවල් අතර අන්තර් සබඳතාව ගොඩනැංවීම සඳහා පුරෝගාමී ලෙස දායක වීම.

## 1.3. ප්‍රධාන කාර්යයන්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු සමස්ථ කාර්යභාරය ක්‍රියාවලි 4ක් ඔස්සේ සිදු කරනු ලබයි.

### 1.3.1. ලියාපදිංචිය

I. විශ්‍රාම වැටුප් ලියාපදිංචිය

- සිවිල්

රාජ්‍ය සේවකයින්, පිරිවෙන් ගුරු, පෞද්ගලික පාසල් ගුරු, 2006.01.02 දිනට පෙර විශ්‍රාම ලැබූවන්, අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ලබන්නන්, විනය හේතූන් මත විශ්‍රාම ගැන්වූවන් විශ්‍රාම වැටුප් සඳහා වන ලියාපදිංචි කිරීම

- සන්නද්ධ සේවා

සන්නද්ධ සේවා නිලධාරීන්ගේ සේවා කාලය අවසන් වීමෙන් විශ්‍රාම ලැබීම් සඳහා ලියාපදිංචි වීම, විශේෂ වන්දි හා වන්දි විශ්‍රාම වැටුප් සඳහා ලියාපදිංචිවීම්, සේවයේ යෙදී සිටියදී සිදුවන මියයාමකදී උරුමකරුවන් වෙත ගෙවන මරණ පාරිතෝෂික ප්‍රතිලාභය සඳහා ලියාපදිංචි කිරීම

II. වැන්දඹු හා අනත්දරු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ලියාපදිංචිය

රාජ්‍ය සේවකයකුගේ හෝ විශ්‍රාමිකයකුගේ අභාවයකින් අනතුරුව වැන්දඹු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ලියාපදිංචි කිරීම, රාජ්‍ය සේවයේ යෙදී සිටියදී මියයන රාජ්‍ය සේවකයින් සහ ත්‍රස්තවාදී හේතූන් මත මියයන රාජ්‍ය සේවකයින් යන අයවලුන් සඳහා මරණ පාරිතෝෂික අංක ලබාදීම

III. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ලියාපදිංචිය

රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් රහිත පත්වීම් දරන්නන් වෙත සේවා අවසාන ප්‍රතිලාභ තහවුරු කිරීම සඳහා ලියාපදිංචි කිරීම

### 1.3.2. ගෙවීම් නියාමනය.

විශ්‍රාම වැටුප්, වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් ආදී මාසිකව සිදු කරන ගෙවීම් ද, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම්, වැන්දඹු හා අනත්දරු අරමුදල් ආපසු ගෙවීම්, විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගෙවීම්, මරණ පාරිතෝෂික ගෙවීම්, විශ්‍රාම වැටුප් හිමිකම නොලබා සේවයෙන් ඉවත්වන සන්නද්ධ සේවා නිලධාරීන්ගේ සේවා පාරිතෝෂික හා සිවිල් සේවා පාරිතෝෂික සැකසීම, විශේෂ වන්දි ගෙවීම්, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම, විදේශගත විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ආදී ගෙවීම් නිරවද්‍යතාවයෙන් යුතුව නියාමනය කිරීම

### 1.3.3. ලැබීම් නියාමනය


වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු අරමුදල් ලැබීම්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම්, පළාත් පාලන අයතන අරමුදල් ලැබීම්, ගොඩනැගිලි කුලී සහ නිවාඩු නිකේතන ආදායම් නියාමනය කිරීම

### 1.3.4. සංවර්ධන ප්‍රවේශය

මානව සම්පත් සංවර්ධනය, තොරතුරු තාක්ෂණික සංවර්ධනය, විෂය සංවර්ධනය හා භෞතික සම්පත් සංවර්ධනය යන මානයන් හතර ඔස්සේ දෙපාර්තමේන්තු සංවර්ධන කටයුතු සිදු කිරීම.

## 1.4. සංවිධාන සටහන

සංවිධාන සටහන



- **විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය- 2019.12.31 දිනට**

| තනතුරේ ස්වභාවය | තනතුර | අදාළ වන සේවය | වැටුප් ක්‍රමය | අනුමත මුළු තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | SLAS (Special) | SL-3-2016 | 1 | 1 | 0 |
| | අතිරේක විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | SLAS (Special) | SL-3-2016 | 1 | 1 | 0 |
| | වෛද්‍ය නිලධාරී | Primary Grade | SL-2-2016 | 1 | 0 | 1 |
| | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ | SLAS (Class I) | SL-1-2016 | 4 | 2 | 2 |
| | ප්‍රධාන ගණකාධිකාරී | SLAcS(Class I) | SL-1-2016 | 1 | 1 | 0 |
| | ප්‍රධාන අභ්‍යන්තර විගණක | SLAcS(Class I) | SL-1-2016 | 1 | 1 | 0 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | SLAS(Class II or III) | SL-1-2016 | 10 | 8 | 2 |
| | ගණකාධිකාරී | SLAcS(Class I) | SL-1-2016 | 1 | 1 | 0 |
| | ගණකාධිකාරී | SLAcS(Class II or III) | SL-1-2016 | 9 | 8 | 1 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | SLITS(Class II or III) | SL-1-2016 | 1 | 1 | 0 |
| | නීති නිලධාරී | Dept | SL-1-2016 | 1 | 1 | 0 |
| | Software Developer | Dept | Contract | 3 | 1 | 2 |
| | | | | **34** | **26** | **8** |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරී | PMAS (Supra) | MN-7-2016 | 4 | 2 | 2 |
| | භාෂා පරිවර්තක<br>සිංහල - ඉංග්‍රීසි 01<br>සිංහල - දෙමළ 01 | TS | MN-6-2016 | 2 | 2* | 0 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | SLICTS | MN-6-2016 | 5 | 1 | 4 |
| | | | | **11** | **5** | **6** |
| ද්විතීය මට්ටම | කාර්මික නිලධාරී | SLTS | MN-3-2016 | 1 | 0 | 1 |
| | අයවැය සහකාර | RS | MN-4-2016 | 1 | 1 | 0 |
| | විශ්‍රාම වැටුප් නිලධාරී | Dept. | MN-4-2016 | 340 | 233 | 107 |
| | සංවර්ධන නිලධාරී | DOS | MN-4-2016 | 398 | 397 | 1 |
| | රාජ්‍ය කළමනාකරණ සහකාර | PMAS | MN-2-2016 | 190 | 175 | 15 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | SLICTS | MT-1-2016 | 5 | 3 | 2 |
| | ලේඛණ සහකාර | Dept. | MN-1-2016 | 141 | 122 | 19 |
| | Help Desk Operator | Dept. | Contract | 2 | 0 | 2 |
| | | | | **1078** | **931** | **147** |
| ප්‍රාථමික මට්ටම | බංගලා භාරකරු | Dept. | PL-1-2016 | 2 | 1 | 1 |
| | අරක්කැමි / උද්‍යාන කම්කරු | Dept. | PL-1-2016 | 4 | 3 | 1 |
| | රියදුරු | DS | PL-3-2016 | 12 | 12 | 0 |
| | විදුලි කාර්මික | Dept. | PL-3-2016 | 1 | 0 | 1 |
| | කාර්යාල කාර්ය සහායක | OES | PL-1-2016 | 56 | 55 | 01 |
| | | | | **75** | **71** | **04** |
| **එකතුව** | | | | **1198** | **1033** | **165** |

***භාෂා පරිවර්තක** - සේවයේ නියුතු සේවක සංඛ්‍යාව:- සිංහල - ඉංග්‍රීසි - 01
ඉංග්‍රීසි - දෙමළ - 01

## 1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

### I. පාලන අංශය

දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම හා සියළුම නිලධාරීන්ගේ පාලන කටයුතු සිදු කිරීම, දෙපාර්තමේන්තුවේ සියළුම ගොඩනැගිලි ඉදිකිරීම හා නඩත්තු කටයුතු කිරීම, දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය සේවාවන් සපයා දීම හා ඒ සඳහා ගෙවීම් කටයුතු කිරීම, දෙපාර්තමේන්තුවේ සියළුම වාහන නඩත්තුව, සේවා කිරීම හා අළුත්වැඩියා කිරීම, දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර හා උපකරණ අළුත්වැඩියා කිරීම හා සේවා කිරීම, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත පුහුණු අවස්ථා ලබා දීම සහ තොරතුරු පනතට අදාල රාජකාරි කටයුතු සිදු කිරීම මෙම අංශය මගින් සිදු කෙරේ.

මානව සම්පත් සංවර්ධනය කිරීම උදෙසා පාලන අංශය මගින් පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සිදුවේ. එහිදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ විෂය දැනුම වර්ධනය කිරීමේ හා නව ප්‍රවණතා පිළිබඳ යාවත්කාලීන කිරීම් පිළිබඳ විෂය මූලික වැඩසටහන් ද, ආකල්ප හා කුසලතා සංවර්ධන වැඩසටහන්ද, අභ්‍යන්තර හා බාහිර පුහුණු වැඩසටහන් වශයෙන් සංවිධානය කෙරේ. මෙහිදී විවිධ සම්පත්දායකයින් හා ආයතන සම්බන්ධ කරගෙන මෙකී පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. එමෙන්ම දෙපාර්තමේන්තුගත මානව සම්පත්, සම්පත්දායකත්වය ලෙස යොදා ගනිමින් විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව වෙනත් ආයතන දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමද මෙම අංශයේ විෂය පථය යටතේ සිදු කරනු ලැබේ.

- දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ගුණාත්මකභාවයෙන් යුතු කාර්යක්ෂම සේවාවක් පවත්වා ගැනීම අරමුණු කොට ගෙන දෙපාර්තමේන්තුවේ ඉහළ සිට පහළ දක්වා විහිදුණු ධූරාවලියෙහි සියළුම නිලධාරීන් ආවරණය වන පරිදි විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීමට 2019 වර්ෂයේදී කටයුතු සිදු කරන ලදී. ඒ අතරින් සියළුම දෙපාර්තමේන්තු නිලධාරීන් ආවරණය වන පරිදි සිදුකරන ලද සේවක අභිප්‍රේරන වැඩසටහන්, කාර්යාල ක්‍රම හා ලිපි සැකසීම පිළිබඳ වැඩසටහන් හා ඵලදායිතා ප්‍රවර්ධනය පිළිබඳ වැඩසටහන් ප්‍රමුඛස්ථානයක් ගනී.

- 14/2019 විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීම සම්බන්ධයෙන් සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් හා ගණකාධිකාරීවරුන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් පවත්වන ලද අතර ඊට සමගාමීව විශ්‍රාම වැටුප් විෂයභාර නිලධාරීන් පුහුණු කිරීම සිදු කරන ලදී.

- තවද රාජ්‍ය ආයතන අතර ඉහළ ගුණාත්මක සේවාවක් සපයනු ලබන රාජ්‍ය ආයතනයක් වශයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය අන්තර්ජාතික ප්‍රමිතියෙන් යුතුව පවත්වා ගැනීම සඳහා 2019 වර්ෂය තුල 1000 කට අධික රාජ්‍ය නිලධාරීන් ප්‍රමාණයක් දැනුවත් කිරීම, පුහුණු කිරීම සඳහා සම්පත්දායකයින් ලබා දීම සිදු කර ඇත.

- ඒ අනුව දකුණු පළාත් රාජ්‍ය සේවා නිලධාරීන් විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 2 ක් දකුණු පළාත් සංවර්ධන හා පුහුණු ආයතනයේදී සිදු කරන ලදී. එසේම යාපනය, කිලිනොච්චි, මන්නාරම, මුලතිව් හා වව්නියා දිස්ත්‍රික්කයන්හි සේවය කරනු ලබන ගණකාධිකාරීවරුන් පුහුණු කිරීම සහ නැගෙනහිර පළාත, දකුණු පළාත හා උතුරු මැද පළාත ආවරණය වන පරිදි විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම සිදු කරන ලද අතර වෛද්‍යවරුන්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සහ මධ්‍යම පළාත් රාජ්‍ය නිලධාරීන් විශ්‍රාම වැටුප කඩිනම් කර ගැනීම සම්බන්ධව දැනුවත් කිරීම සිදු කරන ලදී.

- මානව සම්පත සංවර්ධනය කිරීමෙහිලා නිලධාරීන්ගේ මානසික මට්ටම යහපත්ව පවත්වා ගෙන යා හැකි කාර්යාල පරිසරයක් නිර්මාණය කිරීම සඳහා කාර්යාල පරිසරය නවීකරණය කිරීම, සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම, දක්ෂතාවය ඇති නිලධාරීන් හඳුනාගෙන ඔවුන් සඳහා ක්‍රිකට්, කැරම් වැනි විවිධ තරඟ සඳහා සහභාගීවීමේ අවස්ථාව ලබාදීම, අලුත් අවුරුදු උත්සවය පැවැත්වීම වැනි විවිධ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී.

- දෙපාර්තමේන්තුව තුල සන්නිවේදන කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා නව අභ්‍යන්තර දුරකතන සන්නිවේදන පද්ධතියක් ස්ථාපිත කිරීම සහ විශ්‍රාමිකයින්ගේ ගැටළු සඳහා ඉතා කඩිනමින් පිළිතුරු සපයනු වස් අක්‍රියව පැවති 1970 ක්ෂණික දුරකතන අංකය නැවත ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. එම කාර්යය සඳහා වෙනමම දෙපාර්තමේන්තු නිලධාරීන් යොදවා ඇති අතර එමඟින් විශ්‍රාමිකයා හට දුරකතනය මගින් තොරතුරු විමසීමේදී පෙර පැවති දුෂ්කරතා මඟ හරවා ගැනීමට හැකිවී ඇති අතර කඩිනමින් පිළිතුරු ලබාගැනීමට අවකාශය ලැබී ඇත.

- විශ්‍රාමිකයා හට සෘජුවම අදාල මාණ්ඩලික නිලධාරියා හමුවී තම ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා අවස්ථාව ලබා දෙමින් සෑම බදාදා දිනකම මහජන දින වැඩසටහන පවත්වනු ලබන අතර ඒ සඳහා දිනකට විශ්‍රාමිකයින් 500 කට අධික ප්‍රමාණයක් සහභාගී වේ. එමඟින් ඔවුන්ගේ ගැටළු සඳහා කඩිනම් විසඳුම් ලබා දෙන අතර බදාදා දින හැර අනෙකුත් දිනයන්හිදී “ඉදිරි මෙහෙයුම් කවුළුව” සඳහා මාණ්ඩලික නිලධාරියෙක් යොදවා විශ්‍රාමිකයින් හට ඔවුන්ගේ ගැටළු විසඳා ගැනීමට අවස්ථාව සලසා දී ඇත.

- 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලබයි. එමඟින් 2019 වර්ෂයේ ඉදිරිපත් වූ විශ්‍රාමික ගැටළු සියල්ලක් සඳහාම පිළිතුරු සපයා ඇති අතර වර්ෂයේ ඉල්ලීම් 192 ක් ලැබී ඇත. මෙමඟින් පුද්ගලික විශ්‍රාම වැටුප් සම්බන්ධ ගැටළු සඳහා තොරතුරු පනතේ විධිවිධාන අනුව දින 14ක් තුල පිළිතුරු යැවීම සිදු කරන අතර නොදැනුවත්භාවය මත තමන්ගේ නොවන විශ්‍රාම වැටුප් සම්බන්ධ ගැටළු හෝ තොරතුරු ඉල්ලීම් සම්බන්ධයෙන් පිළිතුරු සැපයීම සිදු නොකරයි. යම් පුද්ගලයෙක් ලද පිළිතුරු පිළිබඳ සෑහීමකට පත් නොවන්නේ නම් එම ඉල්ලීම් සම්බන්ධව ලැබෙන අභියාචනා සඳහා නම් කල නිලධාරී මගින් පිළිතුරු සැපයෙන අතර එයින්ද සෑහීමකට පත් නොවේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කල හැකි අතර ඔවුන් විසින් කැඳවනු ලබන දිනයකදී ඒ සඳහා කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම සිදු කරයි. 2019 වර්ෂයේදී දෙවරක් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිට ඇත.

- තවද “ජනපතිට කියන්න” වැඩසටහන යටතේ 2019 වර්ෂයේදී අප දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද විශ්‍රාමික ගැටළු 1176 ක් සඳහා පිළිතුරු ලබා දී ඇත. විශ්‍රාමික ගැටළු 280ක් ක්‍රියාත්මක තත්ත්වයේ පවතින අතර ගැටළු 141 ක් වෙනත් ආයතන වෙත යොමු කර ඇත.

- 2019 වර්ෂය අවසන් වන විට දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ගේ (1025) 2020 වර්ෂයට අදාල වැටුප් පරිවර්තනයන් සිදු කර අවසන් කර ඇත.

- 2014 වර්ෂයේ සිට අනුමත කිරීමට කටයුතු ආරම්භ කරන ලද බංගලා භාරකරු තනතුරට අදාල බඳවා ගැනීමේ පටිපාටිය සඳහා 2019 වර්ෂයේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී ඇත.

- රියදුරු සහ කාර්යාල සේවක සේවයේ නිලධාරීන්ගේ III පන්තියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වා ඇත.

- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිහිටි ගොඩනැගිල්ලේ දෙපාර්තමේන්තුව ප්‍රයෝජනයට නොගන්නා ඉඩ ප්‍රමාණයන් වෙනත් ආයතන වෙත කුලී පදනම මත ලබාදී ඇති අතර එමඟින් මාසිකව ආදායම් රැස් කිරීම සිදු කරනු ලැබේ. 2019 වර්ෂයේ ගොඩනැගිලි කුලී ලැබීම්වල වටිනාකම රු.27,656,955 ක් වේ. එමෙන්ම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාමික ප්‍රජාව ඇතුළු සමස්ථ මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා පවත්වාගෙන යනු ලබන නිවාඩු නිකේතන පාලනය කිරීම හා නඩත්තු කිරීම් කටයුතු පවත්වාගෙන යාම සහ එමගින් මාසිකව ආදායම් ඉපැයීම සිදු කරනු ලැබේ.

- ලිපි ගොනුවල දීර්ඝ කාලීන පැවැත්ම තහවුරු කර ගැනීමට සහ ලිපිගොනු පහසුවෙන් සොයාගැනීමට හැකි වන පරිදි 5 වන මහලේ සිවිල් ලේඛනාගාරය ස්ථාපිත කර ඇත. එහි රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලිපිගොනු, විදේශගත විශ්‍රාමික ලිපිගොනු, සිවිල් විශ්‍රාම වැටුප් ලිපිගොනු සහ පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ලිපිගොනු වශයෙන් වර්ගීකරණය කර අසුරා ඇති අතර මේ වන විට ලිපිගොනු 100,000ක් පමණ තැන්පත් කර ඇත.

## II. සිවිල් විශ්‍රාම වැටුප් අංශය

- **විමධ්‍යගත අංශය**

දිවයින පුරා විසිරී සිටින රාජ්‍ය නිලධාරීන් හා සන්නද්ධ සේවා නිලධාරීන් තම සේවා කාලය අවසන් කිරීමෙන් පසුව විශ්‍රාම ගන්වා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ගෙවීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ලියාපදිංචි කර විශ්‍රාම වැටුප් අංකය ලබා දීම, විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියට විශ්‍රාමිකයා ඇතුළත් කර කඩිනමින් ප්‍රථම ගෙවීම ආරම්භ කිරීම, පොලිස් යැපීම් දීමනා, විශේෂ වන්දි සහ වන්දි විශ්‍රාම වැටුප් ගෙවීම ඇතුළු විශ්‍රාමිකයාට හිමි සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීමට අවශ්‍ය පහසුකම් සැලසීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි විමධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය ඔස්සේ සිදු කරනු ලබයි.

දළ වශයෙන් වසරකට රාජ්‍ය සේවයෙන් තිස්පන්දහසකට අධික රාජ්‍ය සේවකයින් ප්‍රමාණයක් විශ්‍රාම ගැන්වෙන අතර 2019 වසරේ දී විශ්‍රාම ගැන්වීම සඳහා දෙපාර්තමේන්තු විමධ්‍යගත අංශයට ලැබුණු අයදුම්පත්‍ර සංඛ්‍යාව 30,143 කි. අදාළ අයදුම්පත් සංඛ්‍යාව අතරින් විශ්‍රාම ගනු ලබන සෑම නිලධාරියකුම අනිවාර්යයෙන් එක්වරක් සහභාගී විය යුතු සත්කාර පියසෙහි සම්මුඛ පරීක්ෂණය සඳහා යොමු කරන ලද අයදුම්පත්‍ර සංඛ්‍යාව 26,386 කි. ජාතික හැඳුනුම්පත, අයදුම්පත හා ඇමුණුම්වල නමෙහි පවතින පරස්පරතා, සේවා කාලය නිවැරදිව ගණනය නොකිරීම, ස්ථිර හා තාවකාලික සේවා කාල නිවැරදිව නියමිත ස්ථානයන්හි සඳහන් කර නොතිබීම, වැටුප් පරිවර්තන ලිපිය හා මාර්ගගත පද්ධතිය අතර තොරතුරුවල පරස්පරතා, අපැහැදිලි ඇමුණුම්, වැන්දඹු හා අනත්දරු දායක මුදල් අයකිරීම පිළිබඳ සහතිකය ඉදිරිපත් නොකිරීම වැනි විවිධ හේතු මත පදනම් වී 2019 වර්ෂයේ ලද අයදුම්පත් වලින් 30%ක ප්‍රමාණයක් ප්‍රතික්ෂේප කිරීමට හා හරවා යැවීමට සිදු විය.

**විශ්‍රාම වැටුප් ගෙවීම්**

| මාසය | මාර්ගගත විශ්‍රාම වැටුප් ගෙවීම් | සිවිල් - Source Document | හමුදා - Source Document | වන්දි විශ්‍රාම වැටුප් - Source Document | පොලිස් යැපෙන්නන් ගේ දීමනා | විශේෂ වන්දි |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 631 | 12 | 5 | 3 | 22 | 56 |
| පෙබරවාරි | 2,495 | 6 | 15 | 1 | 19 | |
| මාර්තු | 2,444 | 8 | 12 | 0 | 13 | |
| අප්‍රේල් | 3,079 | 6 | 45 | 1 | 17 | |
| මැයි | 1,041 | 5 | 6 | 2 | 23 | |
| ජූනි | 2,170 | 8 | 1 | 2 | 27 | |
| ජූලි | 2,053 | 2 | 0 | 2 | 24 | |
| අගෝස්තු | 2,110 | 4 | 0 | 2 | 32 | |
| සැප්තැම්බර් | 1,891 | 4 | 1 | 1 | 2 | |
| ඔක්තෝබර් | 2,289 | 4 | 0 | 0 | 13 | |
| නොවැම්බර් | 2,237 | 9 | 0 | 1 | 11 | |
| දෙසැම්බර් | 3,510 | 6 | 1 | 1 | 4 | |
| **එකතුව** | **25,950** | **74** | **86** | **16** | **207** | **56** |

- **මධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය**

රා.ප.ච. අංක 16/1999 හා 02/2008 යන චක්‍රලේඛ ප්‍රකාරව ආයතන ප්‍රධානීන්ට බලය දී ඇති විමධ්‍යගත නොවන සියළුම විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීම, විමධ්‍යගත හා මධ්‍යගත යන සියළුම සංශෝධිත විශ්‍රාම වැටුප් අනුමත කිරීම හා විශ්‍රාම වැටුප් ලබා ගැනීමට පෙර මියගිය නිලධාරීන්ගේ පාරිතෝෂික හා හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීම මෙම අංශය මගින් සිදු කෙරේ.

රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ නිලධාරීන් / නිලධාරිනියන්ගෙන් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමි නිවැරදි පුද්ගලයින් තෝරා ගැනීම, ඔවුන්ගේ විශ්‍රාම වැටුප් හිමිකම ලියාපදිංචි කර ප්‍රදානය නිකුත් කිරීමේ සිට විශ්‍රාම වැටුප් ගණනය කර ගෙවීම් කිරීම දක්වා ඇතුළත් සියලුම කාර්යභාරයන් විශ්‍රාම වැටුප් ප්‍රථම ගෙවීමට ඇතුළත් වේ. පොදු 55 මගින් විශ්‍රාම වැටුප් ප්‍රථම ගෙවීම් සිදු කරයි.

වර්තමානයේ විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමික නිලධාරීන් / නිලධාරිනියන්ගේ සේවා කාලය තුළ සිදුවිය යුතු සංශෝධනයන් විශ්‍රාම ගැන්වීමෙන් පසු සිදු කිරීම විශ්‍රාම වැටුප් සංශෝධන යටතේ සිදු වේ.

විශ්‍රාම ගිය නිලධාරියා / නිලධාරිනිය එම විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා ගැනීමට පෙර මිය ගිය හොත් එම ප්‍රතිලාභ උරුමකරුවන් වෙත ගෙවීම් කිරීම 2 සහ 39 උරුමකරුවන් සඳහා ගෙවීම් කිරීම යටතේ සිදු වේ.

- **පොදු 55 යටතේ විශ්‍රාම වැටුප් ප්‍රථම ගෙවීම් සහ 2 සහ 39 උරුමකරුවන් සඳහා ගෙවීම් - 2019**

| | 2018.12.31 ශේෂය | ලද අයදුම්පත් සංඛ්‍යාව | ගෙවීම් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව | ආපසු යවන ලද අයදුම්පත් සංඛ්‍යාව | තවදුරටත් ක්‍රියාත්මක කිරීමට නියමිත අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **පොදු 55** | 351 | 365 | 710 | 15 | 06 |
| **උරුමකරුවන් සඳහා ගෙවීම්** | 90 | 70 | 146 | 08 | 06 |

- **සංශෝධන ගෙවීම් (PD6) සිදු කල අයදුම්පත් සංඛ්‍යාව - 2019**

| මාසය | ලද අයදුම්පත් සංඛ්‍යාව | ගෙවීම් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව | ආපසු යවන ලද අයදුම්පත් සංඛ්‍යාව | තවදුරටත් ක්‍රියාත්මක කිරීමට නියමිත අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2018.12.31 ශේෂය | 477 | | | |
| ජනවාරි | 803 | 591 | 339 | |
| පෙබරවාරි | 568 | 375 | 183 | |
| මාර්තු | 657 | 405 | 246 | |
| අප්‍රේල් | 391 | 246 | 170 | |
| මැයි | 759 | 439 | 268 | |
| ජූනි | 554 | 355 | 202 | |
| ජූලි | 558 | 312 | 208 | |
| අගෝස්තු | 491 | 368 | 214 | |
| සැප්තැම්බර් | 466 | 306 | 244 | |
| ඔක්තෝබර් | 744 | 356 | 262 | |
| නොවැම්බර් | 429 | 281 | 237 | |
| දෙසැම්බර් | 553 | 281 | 188 | |
| **එකතුව** | **7,450** | **4,315** | **2,761** | **374** |

- **ප්‍රතිපත්ති අංශය**

රජයේ විශ්‍රාමික ප්‍රජාව වෙත විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා සම්පාදිතව පවත්නා ප්‍රතිපත්තිමය කරුණු අර්ථ දැක්වීම, අවස්ථානුකූලව එලෙස පවතින ප්‍රතිපත්තිමය කරුණු සංශෝධනය කිරීම හා නව ප්‍රතිපත්ති තීරණ වලට එළඹීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. තවද රජයේ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප සාපේක්ෂ වශයෙන් සාධාරණ මට්ටමකට පවත්වාගෙන යාමට අවශ්‍ය පසුබිම සැකසීමද ප්‍රධාන වගකීමකි.

ව්‍යවස්ථාපිත සංශෝධන සඳහා අදාල වන්නා වූ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ, උපදෙස් ලිපි හා ගැසට් නිවේදන නිකුත් කිරීම සහ විශ්‍රාමික ප්‍රජාව පෞද්ගලිකවද සියළුම රාජ්‍ය ආයතන මට්ටමින්ද යොමු කරනු ලබන ගැටළු නිරාකරණය සඳහා අවශ්‍ය පැහැදිලි කිරීම්/ උපදෙස් සැපයීම ප්‍රතිපත්ති අංශය මගින් ඉටු කෙරෙන කාර්යයන් වේ.

**2019 වර්ෂයේ නිකුත් කර ඇති චක්‍රලේඛ හා උපදෙස් ලිපි**

| | චක්‍රලේඛ අංකය | කාරණය |
|---|---|---|
| 1 | 3/2015 (III) | විශ්‍රාම ගනු ලබන දිනටම විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා දීම. |
| 2 | 1/2019 | 2019 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 ට විශ්‍රාම වැටුප් ගැලපීම |
| 3 | 1/2019 (I) | 2019 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 ට විශ්‍රාම වැටුප් ගැලපීම - පොදු උපදෙස් |
| 4 | 1/2019 (II) | 2019 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 ට විශ්‍රාම වැටුප් ගැලපීම - ත්‍රිවිධ හමුදා නිලධාරීන් සඳහා |
| 5 | 1/2019 (III) | 2019 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 ට විශ්‍රාම වැටුප් ගැලපීම - පොදු උපදෙස් |
| 6 | 1/2019 (IV) | 2019 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 ට විශ්‍රාම වැටුප් ගැලපීම |
| 7 | 2/2019 | 2020 වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීම |
| 8 | 3/2019 | පොලිස් නිලධාරීන් සඳහා දුබලතා විශ්‍රාම වැටුප් ගෙවීම |
| 9 | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අනුමැතිය මෙතෙක් ලබා දී නැත. | විශ්‍රාම වැටුප් ලබන නිලධාරියෙකුට විශ්‍රාම වැටුප් ලබා ගැනීමට අපහසු අවස්ථාවක භාරකරුවෙකු පත් කිරීම පිළිබඳ ගිවිසුම |
| 10 | | තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගෙන ඇති සේවකයින් සඳහා ස්ථිර පත්වීම් ප්‍රදානය |
| 11 | | ක්‍රියාන්විත රාජකාරියේදී ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මිය ගිය ශ්‍රී ලංකා පොලිස් විරුවන්ගේ වැන්දඹු බිරින්දෑවරුන් හා ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් තුවාල ලබා ආබාධිතව වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වා ඇති පොලිස් විරුවන් වෙත රණවිරු සුරැකුම් දීමනාව ගෙවීම |

- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ පැවති නීතිමය ගැටළු අවසන් කර එම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීමට අනුමැතිය ලබා ගැනීමට හැකිවීම මෙම වර්ෂයේ සිදු වූ සුවිශේෂී සිදුවීමකි.

| | උපදෙස් ලිපි | කාරණය |
|---|---|---|
| 1 | 1/2019 | විශ්‍රාම වැටුප සක්‍රීය කිරීම |
| 2 | 2/2019 | රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විශ්‍රාම ගැන්වීමේදී විධිමත් විශ්‍රාම ගැන්වීමේ ලිපියක් නිකුත් කිරීම |
| 3 | 3/2019 | විශ්‍රාම වැටුප් සංශෝධනය කරනු ලබන අවස්ථාවේ දී පාරිතෝෂික ගෙවීම |
| 4 | 4/2019 | 2018.01.01 ට පෙර සේවය අවසන් වී ඇති අමාත්‍යාංශ ලේකම්වරුන් සඳහා රු.25,000 ක විශේෂ දීමනාවක් විශ්‍රාම වැටුපට එකතු කිරීම. |

| | උපදෙස් ලිපි | කාරණය |
|---|---|---|
| 5 | 4/2019 (I) | 2018.01.01 ට පෙර සේවය අවසන් වී ඇති අමාත්‍යාංශ ලේකම්වරුන් හා සමාන්තර වැටුප් තලයන්හි සේවය කල නිලධාරීන් වෙනුවෙන් රු.25,000 ක විශේෂ දීමනාවක් විශ්‍රාම වැටුපට එකතු කිරීම. |
| 6 | 4/2019 (II) | 2018.01.01 ට පෙර සේවය අවසන් වී ඇති අමාත්‍යාංශ ලේකම්වරුන් සඳහා රු.25,000 ක විශේෂ දීමනාවක් විශ්‍රාම වැටුපට එකතු කිරීම. |
| 7 | 5/2019 | වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් නිසි පරිදි අය නොකිරීම. |
| 8 | 6/2019 | හමුදා සේවා සහ දුබලතා විශ්‍රාම වැටුප ඒකාබද්ධ කර ගෙවීම මැයෙන් 2018.07.17 දිනැතිව නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 9/2008 (සංශෝධන II) සඳහා මග පෙන්වීම. |
| 9 | 7/2019 | විශ්‍රාම වැටුප් ගොනු පරිලෝකනය කිරීමේ පද්ධතිය සඳහා පිවිසීමට පහසුකම් සැලසීම. |
| 10 | 9/2019 | PD 3 මාර්ගගත අයදුම්පත්‍රය සංශෝධනය කිරීම. |
| 11 | 10/2019 | උපතේදී ආබාධිත නොවන විට ආබාධිත විශ්‍රාම වැටුප් හිමි ගැන්වීම සඳහා වසර 5කට වරක් වෛද්‍ය මණ්ඩලයට යොමු කල යුතු වීම. |
| 12 | 11/2019 | දුබලතා විශ්‍රාම වැටුප් ලබා ගන්නා විශ්‍රාමික නිලධාරීන්, වෛද්‍ය මණ්ඩලය වෙත යොමු කල යුතු දිනට යොමු නොකිරීම හේතුවෙන් අත්හිටුවා ඇති දුබලතා විශ්‍රාම වැටුප් නැවත සක්‍රීය කිරීම. |
| 13 | 12/2019 | 2020 වර්ෂය සඳහා විදේශගත ශ්‍රී ලාංකික විශ්‍රාමිකයින්ගේ වාර්ෂික ජීවිත සහතික ලබාදීම |

### III. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අංශය

විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරන රාජ්‍ය නිලධාරියෙකු නිලධාරිනියක මියගිය පසු ඔහුගේ/ ඇයගේ කලත්‍රයාට, අනත්දරුවන්ට හා ආබාධිත අනත්දරුවන්ට මාසික විශ්‍රාම වැටුපක් ලබාදීම වැන්දඹු අනත්දරු අංශය ඔස්සේ සිදු කරනු ලබයි.

එමෙන්ම සියලුම රාජ්‍ය සේවකයන් රාජ්‍ය සේවයට ඇතුළත් වීමත් සමඟම වැන්දඹු හා අනත්දරු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ ලියාපදිංචි වීම අනිවාර්ය කාර්යයකි. මාර්ගගත දත්ත පද්ධතියක් ඔස්සේ අදාල රාජ්‍ය නිලධාරියා සේවය කරන ආයතනය මගින් විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතියට පිවිස වැන්දඹු හා අනත්දරු අංක ලබා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා ඇත. එමෙන්ම රාජ්‍ය සේවකයකුගේ හෝ විශ්‍රාමිකයකුගේ අභාවයකින් අනතුරුව වැන්දඹු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ද, රාජ්‍ය සේවයේ යෙදී සිටියදී මියයන රාජ්‍ය සේවකයන් සහ ත්‍රස්තවාදී හේතුන් මත මියයන රාජ්‍ය සේවකයන් යන අයවලුන් සඳහා මරණ පාරිතෝෂික අංක ලබාදීමේ ක්‍රියාවලියද වැන්දඹු අනත්දරු අංශය මගින් සිදු කරනු ලබයි.

- 2019 වර්ෂයේ වැන්දඹු හා අනත්දරු අංක ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත්‍ර 71,085 ලැබී ඇති අතර අයදුම්පත්‍ර 66,715 ක් සඳහා වැන්දඹු හා අනත්දරු ලියාපදිංචි අංක නිකුත් කර ඇත. අයදුම්පත්‍රවල අඩුපාඩු හේතුවෙන් 4,370ක අයදුම්පත්‍ර ප්‍රමාණයක් ප්‍රතික්ෂේප වී ඇත.
- 2019 වර්ෂයේ ආබාධිත අනත්දරු විශ්‍රාම වැටුප් අයදුම්පත් 309 ක් ලැබී ඇති අතර අයදුම්පත්‍ර අඩුපාඩු හේතුවෙන් අයදුම්පත්‍ර 63ක ප්‍රමාණයක් ප්‍රතික්ෂේප වී ඇත.
- 2019 වර්ෂයේ වැන්දඹු හා අනත්දරු අයදුම්පත් 8042ක් ලැබී ඇති අතර අයදුම්පත් 7154ක් සඳහා ගෙවීම් සිදු කර ඇත. අඩුපාඩු සහිතව ඉදිරිපත් වූ අයදුම්පත් 888ක් ප්‍රතික්ෂේප කර ආපසු යවා ඇත.
- 2019 වර්ෂයේ මරණ පාරිතෝෂික අයදුම්පත් 1919ක් ලැබී ඇති අතර එයින් 978ක් සඳහා ගෙවීම් සිදු කර ඇත. අඩුපාඩු සහිතව ඉදිරිපත් වූ අයදුම්පත් 941ක් ප්‍රතික්ෂේප කර ආපසු යවා ඇත.

ලිපි ගොනුවල දීර්ඝ කාලීන පැවැත්ම සහ ලිපිගොනු පහසුවෙන් සොයා ගැනීමට හැකි වන පරිදි තෙවන මහලේ වැන්දඹු හා අනත්දරු ලේඛනාගාරය ස්ථාපිත කර ඇත. එහි පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු ලිපිගොනු, පිරිවෙන් ගුරු, පෞද්ගලික පාසල් ගුරු සහ ගුරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ලිපිගොනු ආදී වැන්දඹු හා අනත්දරු ලිපිගොනු 1,294,700ක් තැන්පත් කර ඇති අතර 850,000ක් පමණ ලිපිගොනු ප්‍රමාණයක් පරිලෝකනය කර අවසන් කර ඇත.

## IV. ගිණුම් අංශය

ජාතියේ උන්නතිය උදෙසා රාජ්‍ය සම්පත් සහ මුදල් කාර්යක්ෂම හා ඵලදායී ලෙස යෙදවීම පිණිස ක්‍රියා කිරීම හා රාජ්‍ය මූල්‍ය නිතිරීති අනුව විනිවිදභාවයෙන් හා වගකීමෙන් යුතු මූල්‍ය පාලනයක් පවත්වාගෙන යාම ගිණුම් අංශය මගින් සිදු කෙරේ.

- **මාසික ගෙවීම් අංශය**

දේශීය සහ විදේශගත විශ්‍රාමිකයින්ගේ සියළු මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් නියාමනය කිරීම මෙම අංශය මගින් සිදු කෙරේ. රාජ්‍ය හා පෞද්ගලික බැංකු පද්ධතිය, තැපැල් කාර්යාල පද්ධතිය, ග්‍රාමීය බැංකු සහ සමූපාකාර සමිති ඔස්සේ නියමිත දිනදී මාසික විශ්‍රාම වැටුප් සියළු විශ්‍රාමිකයින් වෙත ගෙවීමට අදාල සියළු කාර්යයන් ඉතා කාර්යක්ෂම ලෙස ඉටු කරනු ලැබේ.

- **පාරිතෝෂික අංශය**

එක්වරක් පමණක් සිදුකරන ගෙවීම් අතරින් විශ්‍රාම පාරිතෝෂික ගෙවීම, පාරිතෝෂික ගෙවීම් අංශය මගින් සිදු කරනු ලබන අතර විශ්‍රාමිකයාගෙන් රජයට අයවිය යුතු අයවීම් ඇතොත් එකී අයවීම් අයකිරීම සිදුකර ඉතිරි මුදල් විශ්‍රාමිකයාගේ බැංකු ගිණුමට සෘජුවම බැර කෙරේ.

- **විෂමතා අංශය**

2/2006 , 5/2015 විෂමතා හා සම්බන්ධ සියළුම හිඟ ගෙවීම්, විවිධ වැටුප් සංශෝධන හේතුකොට ගෙන හිඟ ගෙවීම් සහ ලක්ෂ 5ට අඩු හිඟ ගෙවීම් සිදු කිරීම මෙම අංශයෙන් සිදු කෙරේ. මෙම සියළු හිඟ ගෙවීම් AR මගින් සිදු කරනු ලබන අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් යොමු කරන AR අයදුම්පත්‍රය නිසි පරීක්ෂාවෙන් අනතුරුව අදාල විෂය නිලධාරියා ගෙවීම තහවුරු කිරීමෙන් පසු ගණකාධිකාරී විසින් හිඟ ගෙවීම සහතික කර ගෙවීමට යොමු කරනු ලැබේ.

Unreduced, Outstanding payment, Disable Allowances, Unpaid Pension Arrears, Allowance Arrears, 55 WOP Revision, Salary Revision WOP (From and Application), Widow/ Orphan Salary Increase වැනි හේතු මත 2019 වසරේ මධ්‍යයේ සිට විෂමතා අංශය මඟින් හිඟ ගෙවීම් සිදු කරනු ලබයි. එසේම Reason 2019 වසරට අලුතින් හඳුන්වා දී ඇති Secretaries Special Allowances 2019, SL – 4 Special Allowances 2019, Political Victimization, Incorrect Basic Pension, 10 years Completed medical Board හිඟ ගෙවීම් විෂමතා අංශය මඟින් සිදු කෙරේ.

- **වැන්දඹු හා අනත්දරු දායක මුදල් අංශය**

රාජ්‍ය සේවකයින්ගේ වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් එක්රැස් කිරීම, යම් රාජ්‍ය සේවකයකු සේවය අවසන් කරන දිනට වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් ලැබිය හැකි ප්‍රතිලාභීන් නොමැති විට හෝ ප්‍රතිලාභීන් සඳහා හිමිකමක් නොමැති විට රාජ්‍ය සේවකයාගෙන් අයකරනු ලැබූ දායක මුදල රාජ්‍ය සේවකයාට හෝ ඔහු හෝ ඇය මිය ගොස් ඇත්නම් ඔහුගේ හෝ ඇයගේ උරුමකරුවන් වෙත ආපසු ගෙවීම් කිරීම වැන්දඹු හා අනත්දරු දායක මුදල් අංශයෙන් සිදු කෙරේ.

1898 අංක 01 දරණ වැන්දඹු අනත්දරු ආඥා පනත හා ඊට අදාල සංශෝධන සහ 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත හා ඊට අදාල සංශෝධන පදනම් කර ගනිමින් සිවිල් රජයේ නිලධාරීන් සඳහාද 1970 අංක 18 දරණ වැන්දඹු අනත්දරු පනත සහ 1998 අංක 60 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු පනත පදනම් කර ගනිමින් සන්නද්ධ හමුදා නිලධාරීන් සඳහා ද දායක මුදල් ආපසු ගෙවීම මෙම අංශයෙන් සිදු කෙරේ. දායක මුදල් ලැබීම් එක්රැස් කර ගැනිම සහ දායක මුදල් ආපසු ගෙවීම් වැන්දඹු අනත්දරු දායක මුදල් ශාඛාවේ මූලික කාර්යයන් වේ.

**දායක මුදල් ආපසු ගෙවීම්**

| | 2015/01/01ට පෙර | 2015/01/01 ට පසු | 2016/10/16 ට පසු මාර්ගගත ක්‍රමයට | හමුදා |
|---|---|---|---|---|
| 2019.01.01ශේෂය | 29 | 64 | 21 | 44 |
| ලැබීම් | 141 | 439 | 1381 | 1465 |
| ගෙවීම් | 118 | 349 | 722 | 1475 |
| return | 05 | 96 | 588 | 34 |
| 2019.12.31 ශේෂය | **47** | **58** | **92** | **0** |

- **සැපයුම් අංශය**

දෙපාර්තමේන්තුවේ අංශයන්හි අවශ්‍යතාවය මත කාර්යාල උපකරණ, ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම, තොරතුරු තාක්ෂණික උපකරණ මිලදී ගැනීම හා තොරතුරු තාක්ෂණ පද්ධති සම්බන්ධ ගිවිසුම් සකස් කිරීම හා ප්‍රසම්පාදන කමිටු පත් කිරීම සැපයුම් අංශය මගින් සිදු කරනු ලබයි.

සැපයුම් අංශයට අයත් භාණ්ඩ ගබඩාව හතර වන මහලේ විධිමත්ව ස්ථාපිත කරනු ලැබූ අතර අංශයන්හි අවශ්‍යතාවය අනුව ගබඩා කළමනාකරණ පද්ධතිය මගින් භාණ්ඩ ඇනවුම් කල හැකි අතර ගබඩාවේ භාණ්ඩ රඳවා ගැනීමකින් තොරව කඩිනමින් භාණ්ඩ ලබා ගැනීමට පහසුකම් සපයා ඇත.

- **වැඩිපුර ගෙවීම් අයකිරීම් අංශය**

විශ්‍රාමිකයින් හට වැඩිපුර ගෙවී ඇති මුදල් නැවත අය කිරීම සහ වෙනත් ආයතන විසින් විශ්‍රාම වැටුපෙන් අයකල යුතු යැයි දැනුම් දෙන ලද (අත්තිකාරම් බී ගිණුමේ ශේෂයන්, වැටුප් වැඩිපුර ගෙවීම් හා සේවා කාලය තුල සිදු කරන ලද වැරදීම් හා අතපසුවීම් වෙනුවෙන් අයකල යුතු මුදල්) අවකරණයන් විශ්‍රාම වැටුපෙන් අයකර අදාල ආයතන වෙත ප්‍රේෂණය කිරීම මෙම අංශයෙන් සිදු කෙරේ.

2019 වර්ෂය තුල වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් අලාභ අයකර අදාල ආයතන වෙත ප්‍රේෂණය කිරීම් රු.7,209,717 ක් වන අතර තවදුරටත් අයකර ගැනීමට ඇති අලාභයන්හි ශේෂය රු.23,881,806 ක් වේ. මෙම වර්ෂයේ දෙපාර්තමේන්තුවට අදාල අලාභ අයකර ගැනීම් රු. 266,794,997 ක් වන අතර අලාභ අයකර ගැනීමේ සාරාංශය පහත පරිදි වේ.

| විස්තරය | මුදල (රු.) |
|---|---|
| 2019.01.01 දිනට ශේෂය | 578,774,907 |
| <u>එකතු කලා</u> | |
| 2019 වර්ෂයේ වාර්තා වූ හානි | 256,413,367 |
| | 835,188,274 |
| <u>අඩු කලා</u> | |
| 2019 වර්ෂයේ අය කරගත් හානි | 266,794,997 |
| **2019.12.31 දිනට ශේෂය** | **568,393,277** |

## V. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අංශය

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල, 1942 අංක 18 දරණ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත යටතේ 1942-04-01 දින මාසික වැටුප් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් රහිත රාජ්‍ය සේවකයින් සඳහා සේවා අවසාන මූල්‍ය ප්‍රතිලාභ සහතික කරනු වස් ආරම්භ කරන ලද අතර 2003 අංක 17 දරණ සංශෝධන මඟින් අරමුදලේ අරමුණු හා පරමාර්ථ තවදුරටත් පුළුල් කර ඇත. මෙම අරමුදල විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ සභාපතිත්වයෙන් අතිරේක සොලිස්ටර් ජනරාල්, කම්කරු කොමසාරිස්, තැපැල්පති හා අරමුදලේ සාමාජිකයෙක්ගෙන් යුතු පංච පුද්ගල කළමනාකරණ මණ්ඩලයක් මගින් කළමනාකරණය කෙරේ.

අරමුදලේ අරමුණ හා පරමාර්ථය වනුයේ විශ්‍රාම වැටුප් රහිත මාසික වැටුප් ලබන රාජ්‍ය සේවකයින් සඳහා අර්ථසාධක ක්‍රමයක් ඇති කිරීමයි. 2003-01-01 දින සිට විශ්‍රාම වැටුප් නොලබන හා කිසිදු සමාජ ආරක්ෂණයක් නොමැති සියලුම රාජ්‍ය සේවකයින් සඳහා අරමුදලේ ප්‍රතිලාභ ලබා ගැනීම ව්‍යාප්ත කර ඇත.

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනත ප්‍රකාරව රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලැබූ නිලධාරීන්ගේ වැටුපෙන් අයවන 8% ක දායක මුදලත්, සාමාජිකයා සේවය කරන ආයතනය විසින් ගෙවනු ලබන 12% ක දායක මුදලත් රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල වෙත බැර වේ. අරමුදල් ආපසු ගෙවීම සඳහා අවශ්‍ය මුදල් හැර අනෙක් සියලු මුදල් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හා ස්ථාවර තැන්පතු වල ආයෝජනය කරනු ලබන අතර එයින් ලැබෙන පොලී සාමාජිකයන් වෙත ප්‍රතිලාභ ලෙස ලබාදීම සිදු වේ. ඒ අනුව 2017, 2018 හා 2019 යන වර්ෂයන්හි දායකයන් වෙත ගෙවා ඇති වාර්ෂික පොලී අනුපාතයන් පිළිවෙලින් 13%, 12.61% හා 10.71% වේ. මෙහි රාජ්‍ය සේවා

අර්ථසාධක අරමුදල් ලැබීම් නියාමනය කිරීම රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අංශය මගින් සිදු කරනු ලබයි.

2019 වර්ෂය සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සඳහා අනිවාර්ය දායක මුදල් (8%) ලැබීම් සහ රජයේ ප්‍රසාද මුදල (12%) රු.887,091,009 ක් වේ. අරමුදලින් වර්ෂය සඳහා ගෙවීම් රු.395,788,303 ක් වේ.

- **රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම් හා ගෙවීම්**

| මාසය | ලැබීම් (රු.) | ගෙවීම් (රු.) |
|---|---:|---:|
| ජනවාරි | 64,588,466 | 23,786,925 |
| පෙබරවාරි | 54,032,633 | 26,387,192 |
| මාර්තු | 74,105,702 | 27,575,262 |
| අප්‍රේල් | 54,465,166 | 20,972,715 |
| මැයි | 73,924,642 | 38,339,792 |
| ජූනි | 79,663,331 | 23,392,525 |
| ජූලි | 80,667,171 | 23,327,934 |
| අගෝස්තු | 72,862,739 | 33,158,406 |
| සැප්තැම්බර් | 76,646,676 | 36,946,687 |
| ඔක්තෝබර් | 105,100,362 | 47,229,265 |
| නොවැම්බර් | 82,983,029 | 35,432,289 |
| දෙසැම්බර් | 68,051,091 | 59,239,312 |
| **එකතුව** | **887,091,009** | **395,788,303** |

- **රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට අලුතින් එකතු වූ හා ඉවත් වූ සාමාජික සංඛ්‍යාව**

| මාසය | ගෙවූ (ඉවත් වූ සාමාජික සංඛ්‍යාව) | අලුතින් එකතු වූ සාමාජික සංඛ්‍යාව |
|---|---:|---:|
| ජනවාරි | 347 | 581 |
| පෙබරවාරි | 224 | 571 |
| මාර්තු | 305 | 641 |
| අප්‍රේල් | 208 | 407 |
| මැයි | 557 | 571 |
| ජූනි | 336 | 920 |
| ජූලි | 312 | 1013 |
| අගෝස්තු | 483 | 1133 |
| සැප්තැම්බර් | 546 | 824 |
| ඔක්තෝබර් | 541 | 652 |
| නොවැම්බර් | 956 | 639 |
| දෙසැම්බර් | 262 | 541 |
| **එකතුව** | **5,077** | **8,593** |

- **2019 වර්ෂය තුල අයදුම්පත් ලැබීම් හා ගෙවීම්**

| මාසය | ලැබුණු අයදුම්පත් ගණන | ගෙවීම් කරන ලද අයදුම්පත් ගණන | ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් ගණන | ඉතිරි අයදුම්පත් ගණන |
|---|---|---|---|---|
| 2018.12.31 දිනට ශේෂය | 582 | | | |
| ජනවාරි | 230 | 347 | 0 | |
| පෙබරවාරි | 510 | 224 | 0 | |
| මාර්තු | 447 | 305 | 72 | |
| අප්‍රේල් | 470 | 208 | 0 | |
| මැයි | 562 | 557 | 0 | |
| ජූනි | 483 | 336 | 0 | |
| ජූලි | 783 | 312 | 79 | |
| අගෝස්තු | 611 | 483 | 0 | |
| සැප්තැම්බර් | 789 | 546 | 0 | |
| ඔක්තෝබර් | 680 | 541 | 195 | |
| නොවැම්බර් | 422 | 956 | 78 | |
| දෙසැම්බර් | 448 | 255 | 0 | |
| **එකතුව** | **7017** | **5070** | **424** | **1523** |

### VI. අභ්‍යන්තර විගණන අංශය

දෙපාර්තමේන්තුවේ මුදල් කටයුතු පිළිබඳව පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමය අධ්‍යයනය කිරීම තුළින් වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ක්‍රමවත් බව පිළිබඳව අඛණ්ඩව ස්වාධීන ඇගයීම පවත්වාගෙන යාම අභ්‍යන්තර විගණන අංශය මගින් සිදු කරනු ලබයි.

2019 වර්ෂයේදී විගණනය කිරීම සඳහා සැලසුම් කරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15න් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් විගණනය කර ඇත. කාර්තු 4 සඳහා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 4 ක් පවත්වා ඇත. තවද සමාලෝචිත වර්ෂය තුල ලද ලිපිගොනු ප්‍රමාණයන් හා පරීක්ෂා කර ඇති ලිපිගොනු ප්‍රමාණයන් පහත පරිදි වේ.

| | ලැබුණු ලිපිගොනු ප්‍රමාණය | පරීක්ෂා කරන ලද ලිපිගොනු ප්‍රමාණය |
|---|---|---|
| ලක්ෂ 10 ට වැඩි හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම් | 425 | 390 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 366 | 335 |
| දෙපාර්තමේන්තුවේ අංශ මගින් | 85 | 60 |
| වෙනත් ආයතන මගින් | 01 | 01 |
| **එකතුව** | **877** | **786** |

## VII. නීති අංශය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සිය කාර්යයභාරය ඉටුකිරීමේදි පැන නඟින නීතිමය ගැටළු නිරාකරණය කිරීම, ඒ හා සම්බන්ධ සියළු ආයතන සම්බන්ධීකරණය, දෙපාර්තමේන්තුව වග උත්තරකරු කරමින් අධිකරණය ඉදිරියේ කෙරෙන පැමිණිලි සම්බන්ධයෙන් පවත්නා නීති රීති විධිවිධාන අනුගමනය කරමින් නිරීක්ෂණ ලබාදීම වෙනුවෙන් නීති අංශය ස්ථාපිත කර ඇත.

**නීති අංශයේ කාර්යභාරය**

- දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් පවත්නා සියලුම නෛතික කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.
- මානව හිමිකම් කොමිසම, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය විසින් ඉදිරිපත් කරනු ලබන පෙත්සම්වලට පිළිතුරු සැපයීම සහ පරීක්ෂණ සඳහා සහභාගි වීම.
- අල්ලස් හා දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාවේ පරීක්ෂණ සඳහා සහභාගි වීම හා අවශ්‍ය වාර්තා සකස් කිරීම.
- නීති අංශයට ඉදිරිපත් වෙන විශ්‍රාමිකයන්ගේ ගැටළුවලට අදාලව නීති උපදෙස් සැපයීම.
- විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන සමඟ දෙපාර්තමේන්තුව විසින් ඇතිකර ගනු ලබන ගිවිසුම් සකස් කිරීම.

ඉහත කාර්යභාරයන්ට අනුකූලව අධිකරණ සහ අනෙකුත් අදාල ආයතන සමඟ උපදේශන සඳහා සහභාගීවීම් හා නිරීක්ෂණ ලබාදී ඇති ප්‍රමාණය 400ක් පමණ වන අතර රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමඟ ඇතිකරගත් ගිවිසුම් සංඛ්‍යාව 21 කි.

## VIII. විදේශ විශ්‍රාම වැටුප් අංශය

වසර දෙකකට වඩා වැඩි කාලයක් විදෙස්ගතව සිටින විශ්‍රාමිකයන්ගේ හා ද්විත්ව පුරවැසිභාවය හිමි විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම්, විශ්‍රාම ගොනු හා බැඳි ක්‍රියා සම්බන්ධීකරණය, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම විදේශ විශ්‍රාම වැටුප් අංශය මගින් සිදු කරනු ලබයි. 2019 වර්ෂය අවසාන වන විට විශ්‍රාම වැටුප් ගෙවූ විදෙස්ගත විශ්‍රාමිකයන් ගණන 9768 කි.

| මාසය | විශ්‍රාමිකයින් ගණන | ගෙවූ මුදල (රු) |
|---|---|---|
| ජනවාරි | 9089 | 207,732,663 |
| පෙබරවාරි | 9162 | 217,444,563 |
| මාර්තු | 9227 | 216,289,219 |
| අප්‍රේල් | 9276 | 225,048,298 |
| මැයි | 9373 | 226,765,954 |
| ජූනි | 9436 | 240,325,376 |
| ජූලි | 9492 | 227,708,651 |
| අගෝස්තු | 9591 | 247,106,699 |
| සැප්තැම්බර් | 9643 | 237,882,224 |
| ඔක්තෝබර් | 9682 | 236,168,601 |
| නොවැම්බර් | 9730 | 240,047,288 |
| දෙසැම්බර් | 9768 | 238,657,104 |
| **එකතුව** | | **2,761,176,640** |

## IX. සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් අංශය

දුබලතා සේවා විශ්‍රාම වැටුප, පරිවර්තික පාරිතෝෂිකය, සේවා පාරිතෝෂිකය, දුබලතා විශ්‍රාම වැටුප, යැපෙන්නන් වෙනුවෙන් ගෙවනු ලබන දීමනාව, මරණ පාරිතෝෂිකය, විශේෂ වන්දි, නැවත සේවා සංශෝධන වැනි කටයුතු හා බැඳි ක්‍රියා සම්බන්ධීකරණය, පාලනය කිරීම හා අධීක්ෂණය කරමින් ගෙවීම් කටයුතු සිදු කිරීම සන්නද්ධ සේවා අංශය මගින් සිදු කරනු ලබයි.

2019 වර්ෂයේ දුබලතා සේවා විශ්‍රාම වැටුප් ගෙවීම් පිළිබඳ ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

- වි.වැ.9/2008 සංශෝධන 11 චක්‍රලේඛය නිකුත් කිරීම. (දුබලතා විශ්‍රාම වැටුප 50/60 සීමාව පිළිබඳ ගැටළුව)
- වි.වැ.6/2019 විශේෂිත ලිපිය (වි.වැ.9/2008 (11) චක්‍රලේඛය පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් දැනුවත් කිරීම සඳහා නිකුත් කල ලිපිය)
- වි.වැ.9/2010 චක්‍රලේඛය සංශෝධනය කරමින් නිසි අවස්ථාවේදී වෛද්‍ය මණ්ඩලයට ඉදිරිපත් නොකළ ආබාධිත හමුදා නිලධාරීන් සම්බන්ධයෙන් වි.වැ.11/2019 විශේෂිත ලිපිය නිකුත් කිරීම

- **මධ්‍යම දත්ත පද්ධතියට එකතු කල විශ්‍රාම වැටුප් ප්‍රමාණ**

| විශ්‍රාම වැටුප් වර්ගය | ගෙවූ සංඛ්‍යාව |
|---|---|
| සේවා විශ්‍රාම වැටුප් ගෙවීම් (10/12 ට අඩු) | 365 |
| දුබලතා ප්‍රථම ගෙවීම් | 647 |
| හමුදා සංශෝධන | 2692 |
| ප්‍රතිශෝධන | 275 |
| මරණ පාරිතෝෂික | 150 |
| සේවා පාරිතෝෂික | 1025 |
| යැපීම් දීමනා | 231 |
| ප්‍රතිශෝධන (10/12 ට අඩු) | 22 |
| හමුදා සංශෝධන (නැවත සේවා) | 129 |
| **එකතුව** | **5536** |

- **ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධීකරණයෙන් විශ්‍රාම වැටුප් ගෙවීම්**

| විශ්‍රාම වැටුප් වර්ගය | ගෙවූ සංඛ්‍යාව |
|---|---|
| දුබලතා | 513 |
| හමුදා (ප්‍රතිශෝධන සහ 2014/10/01 ට පෙර) | 145 |
| යැපීම් දීමනා | 20 |
| සුරැකුම් දීමනා | 455 |
| **එකතුව** | **1133** |

## X. තොරතුරු තාක්ෂණ අංශය

විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය කාර්යක්ෂමව හා නිරවද්‍යව පවත්වාගෙන යාම සඳහා නිරන්තරයෙන් නව තොරතුරු තාක්ෂණ පද්ධති හඳුන්වා දෙමින් විශ්‍රාමික ප්‍රජාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ රාජ්‍ය ආයතන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමඟ සෘජුව සම්බන්ධීකරණය කිරීම මෙම අංශයෙන් සිදු කෙරේ.

## XI. මාධ්‍ය අංශය

සියළුම පුවත්පත් පිළිබඳව අවධානය යොමු කර විශ්‍රාම වැටුප් විෂයට අදාල තොරතුරු රැස් කිරීම හා කළමනාකරණයේ අවධානයට එම තොරතුරු ඉදිරිපත් කිරීම මාධ්‍ය අංශයේ ප්‍රමුඛ කාර්යභාරය වේ. තවද තොරතුරු තාක්ෂණික සංවර්ධනය සමඟ තොරතුරු සන්නිවේදන කටයුතු නවීන තාක්ෂණික උපක්‍රම ඔස්සේ සිදුකිරීම දෙපාර්තමේන්තු මාධ්‍ය ඒකකය මගින් සිදුවේ. එහිදී නිල වෙබ් අඩවිය, නිල Facebook පිටුව, නිල youtube චැනලය, වෙබ් සඟරාව හා විශ්‍රාම රේඩියෝව යන මාධ්‍යයන් ඔස්සේ තොරතුරු යාවත්කාලීන කිරීම ද බාහිර මාධ්‍ය ආයතන වෙත තොරතුරු ලබාදීම ද මාධ්‍ය ඒකකය මගින් සිදු කෙරේ.

- **2019 වර්ෂයේ කැපී පෙනෙන අවස්ථා**
  - **නව හඳුන්වාදීම්**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුළ පවත්නා ක්‍රමවේදයන් සහ පවතින තත්ත්වයන් වැඩිදියුණු කරමින් විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය තව තවත් වැඩිදියුණු කිරීම 2019 වසර තුළදී සිදුවිය.

- **භෞතික වැඩිදියුණු කිරීම්**

නිලධාරීන්ගෙන් වඩාත් ඵලදායී සේවාවක් අපේක්ෂාවෙන් ඔවුන්ගේ රාජකාරි පරිසරය නවීකරණය කරමින් සියළුම අංශවල රාජකාරී සිදු කිරීමට යහපත් වටපිටාවක් ඇති කිරීම සඳහා අවශ්‍ය කාර්යාල පරිශ්‍රයේ නවීකරණයන් සිදු කරනු ලැබිණි.
මේ යටතේ,

- විදේශ විශ්‍රාම, නීති, ප්‍රතිපත්ති සහ හමුදා යන අංශ දෙපාර්තමේන්තු තුන්වන මහලේම නවීකරණය කරන ලද වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමත් සිදු කිරීම.





- අභ්‍යන්තර විගණන සහ රජයේ විගණන අංශ අදියර 3ක් යටතේ නවීකරණය කිරීම.



- සීමිත ඉඩකඩක් පැවති පාලන අංශය පුළුල් වපසරියක් සහිතව තුන්වන මහලේ නවීකරණය කිරීම සහ මාණ්ඩලික නිලධාරීන් ඇතුළු අනෙකුත් නිලධාරීන් 100කට පමණ එකවිට ආහාර පාන ලබා ගත හැකි වන පරිදි භෝජනාගාරය පුළුල් කිරීම.






- හතරවන මහලේ ගිණුම් අංශය නවීකරණය කිරීම.





- ප්‍රතිපත්ති, විදේශ විශ්‍රාම අංශ නවීකරණය කර එකී බිම් වපසරියේ ඉඩ භාවිතා කරමින් නිලධාරීන් 40ක් පමණ රැදී සිටිය හැකි වන පරිදි නව ශ්‍රවනාගාරයක්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් සඳහා නිල කාමරයක් සහ ඊට යාබදව කාර්යය මණ්ඩලය සඳහා ස්ථානයක් නිර්මාණය කරනු ලැබුණි.





- එකවිට 120කට පමණ රැදී සිටිය හැකි වන පරිදි බිම් මහලේ ශ්‍රවනාගාරය නවීකරණය කිරීම.
- පස්වන මහලේ ලේඛනාගාරය විධිමත් කර, විදුලි පරිපථ පද්ධතිය යාවත්කාලීන කිරීම සහ තීන්ත ආලේප කිරීම.




**සාධනීය ප්‍රගතිය**

- ලේඛනාගාරයේ පැවති වැන්දඹු අනත්දරු ලිපිගොනු ලක්ෂ 8.5කට අධික සංඛ්‍යාවක් පරිලෝකනය කර අවසන් කර ඇත.
- ප්‍රාදේශිය ලේකම් කාර්යාල සඳහා පරිගණක බෙදාහරිමින් තොරතුරු තාක්ෂණ පද්ධති මගින් කටයුතු කිරීම සඳහා පවතින බාධාවන් ඉවත් කිරීමට කටයුතු කිරීම හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කර ඇති නිලධාරීන්ගේ පරිහරණය සඳහා අවශ්‍ය ලී බඩු හා අනෙකුත් උපකරණ ලබා දීම මගින් රාජකාරී සිදු කිරීමට යහපත් වටපිටාවක් ඇති කිරීම.
- විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියේ දී විශ්‍රාම වැටුප්ලාභියා ජීවතුන් අතර සිටින බවට තහවුරු කර ගැනීම සඳහා සෑම වසරකදීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, විශ්‍රාමික ප්‍රජාවගෙන් ලබා ගන්නා ජීවිත සහතිකය (Life Certificate) නවීන තාක්ෂණික ක්‍රමෝපායන් සමඟ බද්ධ කරමින් ජෛවමිතික (Biometric) ක්‍රමවේදය ට ලබා ගැනීමේ පහසුකම් සලසන ලදී.







- **වාර්ෂික වැඩසටහන්**

- **ජාතික විශ්‍රාමික දින සැමරුම**

ශ්‍රී ලාංකීය විශ්‍රාමික ප්‍රජාව රාජ්‍ය සේවය වෙනුවෙන් සිදු කලා වූ සේවය මහත් වූ අභිමානයෙන් යුතුව සැමරීමත් ඔවුන් සිදු කළා වූ පරමාදර්ශී මෙහෙවරට ප්‍රණාමය පුද කිරීම සඳහාත් සෑම වර්ෂයකම ඔක්තෝබර් 08 දින ජාතික විශ්‍රාමික දින උළෙල පවත්වනු ලැබේ. මෙවර ද දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි විශ්‍රාමිකයින්ගේ සහභාගිත්වයෙන් ජාතික විශ්‍රාමික දින උළෙල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ගේ සහභාගීත්වයෙන්, ගරු රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍ය රංජිත් මද්දුමබණ්ඩාර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා රාජ්‍ය පරිපාලන ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශ ලේකම් ජේ.ජේ රත්නසිරි මහතාගේ මෙහෙයවීමෙන් 2019 ඔක්තෝබර් මස 08 දින නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලේ දී මහත් වූ උත්කර්ෂයෙන් යුතුව පැවැත්විණි. මෙවර ජාතික විශ්‍රාමික දින උළෙල “විශ්‍රාමයට නවෝදයක්” යන සුවිශේෂී තේමාව පදනම් කොට පවත්වන ලදී.





විද්වත් දේශන, විශ්‍රාමික ප්‍රජාව නියෝජනය කරමින් කරනු ලබන දේශන, යුද්ධ හමුදා නර්තන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද ගීත හා නර්තනාංග සහ රොඩ්නි වර්ණකුල මහතා ඇතුළු කලා ශිල්පීන් ඉදිරිපත් කරන ලද හාස්‍යජනක කෙටි නාට්‍යයෙන් උළෙල වර්ණවත් විය.





එමෙන්ම විශ්‍රාමික ප්‍රජාව වෙනුවෙන් ඩයලොග් ආසියාටා සමාගම විශ්‍රාමිකයින්ට උපකාරී වන තොරතුරු ලබා ගත හැකි Sri Lanka Pensions App හඳුන්වාදීම මෙවර උළෙලේ විශේෂත්වයක් විය. නිර්මාණශීලී කලා අංගයන්ගෙන් වර්ණවත් වූ මෙවර ජාතික විශ්‍රාමික දින උළෙල සඳහා සහභාගී වූ විශ්‍රාමිකයින් හට පෞද්ගලික අංශයේ විවිධ ආයතන වල මූල්‍ය අනුග්‍රහය මත තිළිණ ප්‍රදානය කරන ලදී.






## ➢ විශ්‍රාම වැටුප් ගෙවීම් (ප්‍රස්ථාර සහ වගු මගින්)

- **වාර්ෂික විශ්‍රාමිකයින් සංඛ්‍යාව**


| වර්ෂය | විශ්‍රාමිකයින් ගණන |
|---|---|
| 2014 | 546,379 |
| 2015 | 560,462 |
| 2016 | 579,508 |
| 2017 | 600,867 |
| 2018 | 621,905 |
| 2019 | 639,984 |




මූලාශ්‍රය : ගිණුම් අංශය

- **පළාත් අනුව විශ්‍රාමික ව්‍යාප්තිය -2019**

| පළාත | විශ්‍රාමිකයින් ගණන | මුදල |
|---|---|---|
| ඌව පළාත | 34,875 | 984,862,554 |
| නැගෙනහිර පළාත | 26,445 | 750,549,807 |
| සබරගමුව පළාත | 51,894 | 1,550,169,605 |
| වයඹ පළාත | 74,017 | 2,199,409,129 |
| මධ්‍යම පළාත | 82,975 | 2,453,696,430 |
| උතුරු මැද පළාත | 42,664 | 1,251,462,999 |
| උතුරු පළාත | 21,040 | 601,974,812 |
| බස්නාහිර පළාත | 218,909 | 6,565,949,332 |
| දකුණු පළාත | 77,397 | 2,315,072,740 |
| විදේශ විශ්‍රාම වැටුප් | 9,768 | 238,657,104 |
| **එකතුව** | **639,984** | **18,911,804,512** |





මූලාශ්‍රය : ගිණුම් අංශය

- **මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් සාරාංශය**

| මාසය | සමස්ථ සක්‍රිය විශ්‍රාමිකයින් ගණන | | |
|---|---|---|---|
| | සිවිල් සහ හමුදා | වැන්දඹු හා අනාත්දරු | එකතුව |
| ජනවාරි | 429,489 | 192,027 | 621,516 |
| පෙබරවාරි | 431,199 | 192,218 | 623,417 |
| මාර්තු | 433,015 | 192,314 | 625,329 |
| අප්‍රේල් | 435,272 | 192,657 | 627,929 |
| මැයි | 435,520 | 192,504 | 628,024 |
| ජූනි | 436,733 | 192,338 | 629,071 |
| ජූලි | 436,921 | 191,935 | 628,856 |
| අගෝස්තු | 438,874 | 192,379 | 631,253 |
| සැප්තැම්බර් | 440,258 | 192,600 | 632,858 |
| ඔක්තෝබර් | 442,212 | 192,606 | 634,818 |
| නොවැම්බර් | 443,792 | 192,956 | 636,748 |
| දෙසැම්බර් | 446,653 | 193,331 | 639,984 |


| මාසය | අළුතින් එකතු වූ විශ්‍රාමිකයින් ගණන 2019 | | | |
|---|---|---|---|---|
| | සිවිල් | *හමුදා | වැන්දඹු හා අනත්දරු | එකතුව |
| ජනවාරි | 515 | 229 | 352 | 1,096 |
| පෙබරවාරි | 1,648 | 1075 | 813 | 3,536 |
| මාර්තු | 1,677 | 956 | 567 | 3,200 |
| අප්‍රේල් | 2,016 | 1348 | 881 | 4,245 |
| මැයි | 873 | 389 | 509 | 1,771 |
| ජූනි | 1,542 | 853 | 389 | 2,784 |
| ජූලි | 1,513 | 696 | 922 | 3,131 |
| අගෝස්තු | 1,587 | 710 | 702 | 2,999 |
| සැප්තැම්බර් | 1,263 | 816 | 579 | 2,658 |
| ඔක්තෝබර් | 1,311 | 1176 | 356 | 2,843 |
| නොවැම්බර් | 1,583 | 1015 | 853 | 3,451 |
| දෙසැම්බර් | 2,165 | 1602 | 900 | 4,667 |
| එකතුව | 17,693 | 10,865 | 7,823 | 36,381 |




මූලාශ්‍රය : ගිණුම් අංශය


- **මරණ පාරිතෝෂික ගෙවීම් - 2019**

| මාසය | ගෙවන ලද ලිපිගොනු සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 52 |
| පෙබරවාරි | 46 |
| මාර්තු | 94 |
| අප්‍රේල් | 95 |
| මැයි | 57 |
| ජූනි | 74 |
| ජූලි | 79 |
| අගෝස්තු | 107 |
| සැප්තැම්බර් | 45 |
| ඔක්තෝබර් | 140 |
| නොවැම්බර් | 71 |
| දෙසැම්බර් | 118 |
| **එකතුව** | **978** |




- **සක්‍රීය සේවයේ යෙදී සිටියදී ජීවිතක්ෂයට හෝ බෙලහීනතාවයට පත් ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවා සාමාජිකයන්ට වන්දි වැටුප් හා දීමනා ගෙවීම**

| ආයතනය | 2019 දෙසැම්බර් දක්වා | |
|---|---|---|
| | සංඛ්‍යාව | ගෙවූ මුදල රු.බිලියන |
| යුද හමුදා | 36886 | 29.90 |
| නාවික හමුදා | 1490 | 1.27 |
| ගුවන් හමුදා | 539 | 0.48 |
| පොලිස් | 2234 | 1.98 |
| **එකතුව** | **41,149** | **33.63** |




මූලාශ්‍රය : ගිණුම් අංශය


- වාර්ෂික සක්‍රිය සේවයේ යෙදී සිටියදී ජීවිතක්ෂයට හෝ බෙලහීනතාවයට පත් ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවා සාමාජිකයන්ට වන්දි වැටුප් හා දීමනා ගෙවීම්


| | 2015 | | 2016 | | 2017 | | 2018 | | 2019 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පුද්ගලයින් සංඛ්‍යාව | වියදම (රු.) | පුද්ගලයින් සංඛ්‍යාව | වියදම (රු.) | පුද්ගලයින් සංඛ්‍යාව | වියදම (රු.) | පුද්ගලයින් සංඛ්‍යාව | වියදම (රු.) | පුද්ගලයින් සංඛ්‍යාව | වියදම (රු.) |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | 30,115 | 20,516 | 34,756 | 23,682 | 35,599 | 24,717 | 36,895 | 26,959 | 36,886 | 29,897 |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | 1,445 | 1,042 | 1,415 | 1,037 | 1,385 | 982 | 1,486 | 1,139 | 1,490 | 1,271 |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 575 | 405 | 560 | 410 | 534 | 404 | 564 | 427 | 539 | 486 |
| ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව | 2,611 | 1,470 | 2,503 | 1,551 | 2,471 | 1,704 | 2,234 | 1,834 | 2,234 | 1,983 |
| **මුළු වටිනාකම** | **34,746** | **23,433** | **39,234** | **26,679** | **39,989** | **27,808** | **41,179** | **30,359** | **41,149** | **33,637** |
| | | | | | | | | | | |

- පාරිතෝෂික ගෙවීම් - 2019

| පාරිතෝෂික වර්ගය | ගෙවූ සංඛ්‍යාව | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| සිවිල් | 22,658 | 23,826,294,186 |
| මධ්‍යගත | 1,426 | 569,905,539 |
| හමුදා | 207 | 86,298,818 |
| මරණ | 978 | 641,158,406 |
| වෙනත්* | 6,247 | 678,477,355 |
| **එකතුව** | **31,516** | **25,802,134,304** |

* සේවා පාරිතෝෂික (09), සංශෝධන පාරිතෝෂික විශේෂ වන්දි (10 හා සිවිල්), මරණ (17)




- **බැංකු අනුව වාරික හා පොළී ගෙවීම් - 2019**

| මාසය | ප්‍රාග්ධනය (රු) | පොලිය (රු) | වාරික මුදල (රු) |
|---|---|---|---|
| ජනවාරි | 338,730,783 | 606,799,628 | 945,530,410 |
| පෙබරවාරි | 339,198,873 | 611,066,701 | 950,265,574 |
| මාර්තු | 339,198,873 | 548,887,834 | 888,086,707 |
| අප්‍රේල් | 339,196,623 | 594,008,879 | 933,205,502 |
| මැයි | 339,196,623 | 583,708,214 | 922,904,837 |
| ජූනි | 339,196,623 | 599,681,302 | 938,877,925 |
| ජූලි | 339,196,623 | 577,429,975 | 916,626,598 |
| අගෝස්තු | 339,196,623 | 593,604,240 | 932,800,864 |
| සැප්තැම්බර් | 339,196,623 | 590,405,655 | 929,602,278 |
| ඔක්තෝබර් | 339,196,623 | 568,076,381 | 907,273,004 |
| නොවැම්බර් | 339,196,623 | 584,716,052 | 923,912,676 |
| දෙසැම්බර් | 339,196,623 | 561,816,550 | 901,013,173 |
| **එකතුව** | **4,069,898,137** | **7,020,201,410** | **11,090,099,548** |

මූලාශ්‍රය : ගිණුම් අංශය

- **හිඟ වැටුප් ගෙවීම් - 2019**

| මාසය | සංඛ්‍යාව | මාසික වියදම (රු) |
|---|---|---|
| ජනවාරි | 822 | 7,277,926 |
| පෙබරවාරි | 1333 | 48,066,941 |
| මාර්තු | 784 | 36,492,817 |
| අප්‍රේල් | 796 | 35,092,043 |
| මැයි | 622 | 34,638,876 |
| ජූනි | 981 | 50,541,041 |
| ජූලි | 1130 | 80,978,478 |
| අගෝස්තු | 1101 | 55,098,733 |
| සැප්තැම්බර් | 1040 | 63,054,390 |
| ඔක්තෝබර් | 748 | 42,431,921 |
| නොවැම්බර් | 1347 | 70,940,303 |
| දෙසැම්බර් | 976 | 55,472,161 |
| **එකතුව** | **11,680** | **580,085,631** |


හිඟ වැටුප් ගෙවීම් සංඛ්‍යාව
1600
1400
1200
1000
800
600
400
200
0
822
1333
784
796
622
981
1130
1101
1040
748
1347
976
ජනවාරි
පෙබරවාරි
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
ජූලි
අගෝස්තු
සැප්තැම්බර්
ඔක්තෝබර්
නොවැම්බර්
දෙසැම්බර්
සංඛ්‍යාව

## 2. ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු විෂය පථයට අදාළ සියලු ලැබීම් සහ ගෙවීම් නියාමනය කරමින් සමස්ත ක්‍රියාවලිය කාර්යක්ෂමතාවයෙන් යුතුව පවත්වා ගෙන යාම සඳහා අනුවිෂය ක්ෂේත්‍රයන් වෙත බණ්ඩනය කර ඇති අතර 2019 වසරේ දී එම විවිධ අංශයන් මඟින් ක්‍රියාත්මක වූ සේවාවන් රැසක් ප්‍රතිව්‍යුහගත කරනු ලැබීය.

- ✓ රාජ්‍ය සේවයෙහි නිරත රාජ්‍ය සේවකයකු විශ්‍රාම ගැනීම සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ක්‍රියාවලියෙහි මූලික අදියර වන්නේ එකී නිලධාරියා විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය තුළ ලියාපදිංචි කර ගැනීම වන අතර 2019 වසරේ දී විශ්‍රාම වැටුප් ලියාපදිංචි අංශය, විමධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය ලෙස නම් කරමින් සේවාවන් කිහිපයක් ඒකාබද්ධ කරන ලදී.

- ✓ විශ්‍රාම වැටුප් ගෙවීම විධිමත් සහ වේගවත් කිරීම, කාර්යක්ෂම හා ඵලදායිතාවයෙන් යුතුව සිදු කිරීමේ අරමුණින් පෙර සත්කාර පියස යටතේ පැවති කටයුතු විමධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය වෙත ඒකාබද්ධ කිරීම තුළින් එම අංශයන් අතර සම්බන්ධීකරණය වර්ධනය විය.

- ✓ තව ද 2019 දෙසැම්බර් මාසයේ සිට සත්කාර පියසේ කටයුතු කළමනාකරණය සඳහා Queue Management System හඳුන්වා දුන් අතර සත්කාර සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විශ්‍රාමිකයන් වෙත අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව කඩිනමින් සේවා සැපයීමට එමඟින් අවස්ථාව උදා විය.

- ✓ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවීමේ පෙර පැවති ක්‍රමවේදය සංශෝධනය කරමින් 2019.01.01 දින සිට විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීමේ සම්මුඛ පරීක්ෂණයට සහභාගී වී අනන්‍යතාවය තහවුරු කර ගැනීමෙන් අනතුරුව විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය විශ්‍රාමිකයා වෙත ලබා දීම 2019 වසරේ දී ආරම්භ වූ අතර එමඟින් ගෙවීම් කරන පුද්ගලයාගේ අනන්‍යතාව තහවුරු වූ අතර පද්ධතිය තුල ආරක්ෂණ විධිවිධාන වැඩි කිරීමට හැකි විය.

- ✓ ගණන් බැලීම් අංශය, මධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමත් සමඟම එතෙක් විමධ්‍යගතව සිදුවූ විශ්‍රාම වැටුප් සංශෝධන අයදුම් කිරීම ද මධ්‍යගත විශ්‍රාම වැටුප් අංශය හරහා සිදු කිරීම ආරම්භ විය. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2015 සංශෝධන පරිදි ප්‍රථම විශ්‍රාම වැටුප් ලියාපදිංචිය මාර්ගගතව සිදු කිරීමට පියවර ගැනීම මෙම වර්ෂයේදී සිදු කල අතර 2019 ජූලි මස සිට මාර්ගගත දත්ත පද්ධතිය හරහා ගෙවීම් කටයුතු සිදු කිරීම ආරම්භ කරන ලදී.

- ✓ විදෙස්ගත විශ්‍රාමිකයින් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු, විශ්‍රාම ගොනු හා බැඳි ක්‍රියා සම්බන්ධීකරණය, පාලනය කිරීම හා අධීක්ෂණ කටයුතු සිදු කරන විදේශ විශ්‍රාම වැටුප් අංශය ආශ්‍රිතව 2019 වසරේ දී පරිවර්තන රාශියක් සිදු කළ අතර ඒ ඔස්සේ විදේශ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් කරනු ලබන විමසීම් ප්‍රමාණය පසු ගිය වසරට සාපේක්ෂව 50% කින් පමණ අඩු වී තිබේ.

- ✓ 2018 වර්ෂයේ මහකොමසාරිස් කාර්යාල හරහා විශ්‍රාම වැටුප් ගෙවීම් අත්හිටවූ විශ්‍රාම වැටුප් 55%ක් පමණ ප්‍රමාණයක්, විදේශ විශ්‍රාම වැටුප් අංශයේ මඟ පෙන්වීම යටතේ පවත්වා ගෙන යනු ලබන බැංකු ගිණුම් හරහා නැවත ගෙවීම 2019 වසරේ දී ආරම්භ කරනු ලැබීය. ඒ අනුව රු. ලක්ෂ 05 හා ලක්ෂ 10 වැඩි නිවැරදිව ලේඛන භාර දී ඇති සියලු හිඟ විශ්‍රාම වැටුප් මේ වන විට ගෙවා අවසන් කර ඇත.

- ✓ 2019 ජුලි 01 සිට ක්‍රියාත්මක වූ 14/2019 විශ්‍රාම වැටුප් විෂමතාව ඉවත් කිරීම සම්බන්ධයෙන් එකී වර්ෂයට අදාළව නිවැරදි ජීවිත සහතිකය හා ජාතික හැඳුනුම්පත්‍රය ඇති 2500 ක විදේශගත ශ්‍රී ලාංකික විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් විෂමතාවන් සකසා අවසන් කිරීමට කටයුතු කර ඇත.

- ✓ විදේශ තානාපති/මහ කොමසාරිස් කාර්යාල, විදේශ කටයුතු අමාත්‍යාංශය හා බැංකු සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම තුළින් විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය සම්බන්ධ ගැටලු අවමකර ගැනීමට හැකිවීම හා එමඟින් විශ්‍රාම වැටුප් ගෙවීම් ප්‍රමාදයකින් තොරව පවත්වා ගෙන යාමට 2019 වසරේ දී හැකියාව ලැබිණි.

- ✓ අයදුම්පත්‍රයන් හි අඩුපාඩු හේතුවෙන් සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා පරීක්ෂා කිරීමේ ලේඛණයක් හඳුන්වා දීම, ගොනු අස්ථානගත වීම අවම කර ගැනීම සඳහා ක්‍රමවත් ලේඛනාගාරයක් පවත්වා ගෙන යාම මෙන්ම මාර්ගගත ක්‍රමයට අයදුම්පත්‍ර ජීවිත සහතික හා ඉල්ලුම් පත්‍ර ලබා ගැනීමට මූලික අඩිතාලම සකස් කිරීම ආදී සාධනීය වෙනස්කම් රැසක් මෙම වසර තුළ සිදු කරනු ලැබීය.

- ✓ විශ්‍රාම වැටුප් හිමි රාජ්‍ය නිලධාරියකු නිලධාරිනියක මිය ගිය පසු ඔහුගේ/ඇයගේ කලත්‍රයාට, අනත්දරුවන්ට හා ආබාධිත අනත්දරුවන්ට මාසික විශ්‍රාම වැටුප් ලබාදීමේ කාර්යයන්හි නියුතු වැන්දඹු හා අනත්දරු දායක මුදල් අංශයෙහි මූලික කාර්යයන් වන්නේ දායක මුදල් එක් රැස් කර ගැනීම සහ දායක මුදල් ආපසු ගෙවීමයි. දායක මුදල් ආපසු ගෙවීමේ ක්‍රමවේදයෙහි කාර්යක්ෂමතාවය වැඩි කිරීම, එකී ක්‍රියාවලිය වේගවත් කිරීමේ අරමුණින් 2019 වසරෙහි දායක මුදල් ආපසු ගෙවීම සඳහා මාර්ගගත ක්‍රමවේදය හඳුන්වා දෙනු ලැබුණු අතර ඒ අනුව දායක මුදල් ආපසු ගෙවීමේ ක්‍රියාවලිය මේ වන විට වේගවත් කාර්යක්ෂම සේවාවක් බවට පත් වී තිබේ.

- ✓ එමෙන්ම වැන්දඹු හා අනත්දරු දායක මුදල් සම්පූර්ණ සේවා කාලයට අයකර ඇත්ද යන්න සහතික කර ගැනීම සඳහා ආකෘති පත්‍රයක් PD03 අයදුම්පත්‍රයට ඇතුළත් කරනු ලැබීය.

- ✓ රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය කල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව 2017.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ගනු ලැබූ සියළුම රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධන සිදු කිරීමට මාර්ගගත ක්‍රමයක් හඳුන්වා දෙමින් මේ වන විට සමස්ත විශ්‍රාමිකයින්ගෙන් 90% කට වඩා වැඩි ප්‍රතිලාභ හිමි කරදීමට හැකිවී තිබේ.

- ✓ 2019 අයවැය ප්‍රකාශනය අනුව 2016.12.31 දක්වා විශ්‍රාම ගිය සියලුම රජයේ හා ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේත් ඔවුන්ගේ වැන්දඹුවන්ගේත් විශ්‍රාම වැටුප 2017 වර්ෂයේ රජයේ වැටුප් ව්‍යුහයන්ට සමාන්තර වන ලෙස පරිවර්තනය 2019 වසරේ ජුලි මාසයේ සිට ක්‍රියාත්මක වූ අතර වැටුප් ගැලපීම සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මධ්‍යගත දත්ත පද්ධතිය වැඩි දියුණු කරමින් නව තොරතුරු තාක්ෂණ මෘදුකාංගයක් හඳුන්වා දෙනු ලැබිණි. විශ්‍රාම වැටුප් සංශෝධන ක්‍රියාවලිය දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඔස්සේ මාර්ගගත ක්‍රමවේදයට මනා විනිවිදභාවයකින් නිවැරදිව සහ වේගවත්ව සිදු කිරීමට එමඟින් අවස්ථාව හිමි විය.

- ✓ විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලියේ දී විශ්‍රාම වැටුප්ලාභියා ජීවතුන් අතර සිටින බවට තහවුරු කර ගැනීම සඳහා සෑම වසරකදීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, විශ්‍රාමික ප්‍රජාවගෙන් ලබා ගන්නා ජීවිත සහතිකය (Life Certificate) නවීන තාක්ෂණික ක්‍රමෝපායන් සමඟ බද්ධ කරමින්

ජෛවමිතික (Biometric) ක්‍රමවේදය ට ලබා ගැනීමේ මූලික වැඩසටහන් වැඩිදියුණු කිරීම හා 2020 වර්ෂයේදී එය ක්‍රියාත්මක කල හැකි පරිදි නවීකරණය 2019 වර්ෂය අවසානයේදී අවසන් කරන ලදී.

## ❑ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ඉදිරි ගමන්මඟ

- ✓ මධ්‍යගත තොරතුරු තාක්ෂණ පද්ධතිය හා ආයතනික කළමනාකරණ ව්‍යුහය ප්‍රමිතිගත කරමින් සහ වැඩි දියුණු කරමින් 2019 වසරෙහි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි සිදු වූ විශිෂ්ඨ පරිවර්තන ක්‍රියාවලිය ඉදිරියට ගෙනයමින් සමස්ත විශ්‍රාමික ප්‍රජාව වෙනුවෙන් දෙපාර්තමේන්තුව පිරිනමනු ලබන සේවාවන්හි ගුණාත්මකභාවය තව දුරටත් වර්ධනය කිරීම සඳහා ආයතනික විෂය ක්ෂේත්‍රය වසර 2020 හි දී තොරතුරු තාක්ෂණය ඔස්සේ විප්ලවීය පරිවර්තනයක් කරා ගෙන යාමට දෙපාර්තමේන්තුව කටයුතු ආරම්භ කර ඇත.

- ✓ විශ්‍රාමිකයන්ගේ ජීවිත සහතික ලබාදීමේ ක්‍රියාවලිය සඳහා ඇඟිලි සලකුණු ගැනීම 2020 වර්ෂයේ දී ආරම්භ වන අතර 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ගිය නව මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි වූ විශ්‍රාමිකයන් සඳහා ඇඟිලි සලකුණ භාවිතයෙන් ජීවිත සහතිකය ලබාදීමට පහසුකම් සැලසීමට අවශ්‍ය සියලු කටයුතු මේ වන විට සූදානම් කර තිබේ. මේ සඳහා සියලුම රාජ්‍ය හා පෞද්ගලික බැංකුවල මීට අදාළ පහසුකම් සැපයීමට 2020 වර්ෂයේදී කටයුතු කරනු ඇත.

- ✓ එමෙන්ම විශ්‍රාමිකයාගේ සම්පූර්ණ සේවා කාලයට අදාළව වැන්දඹු හා අනත්දරු දායක මුදල් අය කිරීමට අදාළ සහතිකය ලබාදීමේ දී ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රායෝගික ගැටලු (ලේඛන අස්ථානගත වීම/විනාශ වීම් ආදී) සඳහා අවධානය යොමු කරමින් එකී ගැටළු විසඳීමට අවශ්‍ය චක්‍රලේඛ උපදෙස් ලිපි නිකුත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව මේ වන විට මූලික කටයුතු කර ඇත.

- ✓ සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලිපි ලේඛනවල විශේෂයෙන් නම් වල පවතින දෝෂ සහගත තත්ත්වයන් හේතුවෙන් ප්‍රතික්ෂේප වන අයදුම්පත්‍ර සංඛ්‍යාව අවම කර ගැනීමේ අරමුණින් විශ්‍රාම ගැන්වීමට ප්‍රථමයෙන් නිරවුල් කරගැනීමට අවශ්‍ය ගැටලු පිළිබඳ ආයතන දැනුම්වත් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලිපි නිකුත් කිරීමට 2020 වසරේ දී කටයුතු කරනු ඇත.

- ✓ වැරදි වැන්දඹු හා අනත්දරු අංක සහිතව අයදුම්පත්‍ර ඉදිරිපත් වන අතර එය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ අනාවරණය වූ විට නැවත වැන්දඹු හා අනත්දරු ගොනු පරීක්ෂා කිරීමටත් නව අංක ලබා දීමටත් සිදුවීම විශාල කාල සීමාවක් ගත වන ක්‍රියාවලියක් බැවින් මෙම තත්ත්වය අවම කර ගැනීම සඳහා මාර්ගගත නැවත ලියාපදිංචි කරන ලද (Online re-register) වැන්දඹු හා අනත්දරු අංක පමණක් PMS පද්ධතිය සඳහා ඇතුළත් කිරීමෙන් පසු පද්ධතිය තුළ ඉදිරි කටයුතු කිරීම පිළිබඳ මේ වන විට අවධානය යොමු කර ඇත.

- ✓ වැන්දඹු හා අනත්දරු අංකයන්හි වැරදි සහිත අවස්ථා ආදී PMS හි සඳහන් ඇතැම් දත්ත සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේ සංශෝධනය වන බැවින් විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය ඊට ප්‍රථම ආයතන මඟින් ලබා ගන්නා නිසා එහි එවැනි සංශෝධන සටහන් නොවීම පසුකාලීනව ගැටලු ඇති

කරන බව මේ වන විට හඳුනාගෙන තිබේ. එබැවින් සම්මුඛ පරීක්ෂණයේ දී විශ්‍රාම වැටුප සක්‍රීය කළ පසු පමණක් ප්‍රදාන පත්‍රය PMS මඟින් ලබා ගත හැකි වන සේ පද්ධතිය සකස් කිරීමට මේ වන විට විධිවිධාන යොදා තිබේ.

- ✓ එමෙන්ම වසර 2020දී මාර්ගගත ක්‍රමයට දායක මුදල් ආපසු ගෙවීමේදී අදාළ ගෙවීම් පිළිබඳ විශ්‍රාමිකයා මාර්ගයෙන් දැනුම්වත් කිරීමටත් එකී ගෙවීම් පිළිබඳ අදාළ ආයතන දැනුම්වත් වන පරිදි තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීමට හැකියාව ලබා දීම පිළිබඳව මේ වන විට අවධානය යොමු කර ඇත.

- ✓ එමෙන්ම 2020 වසරේ දී ජාතික හැඳුනුම් පත්‍රය නොමැති විදේශගත විශ්‍රාමිකයන් හට විදේශ ගමන් බලපත්‍ර අංකය දත්ත පද්ධතියට ඇතුල් කිරීම මඟින් 14/2019 විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා දැනට පවතින තොරතුරු තාක්ෂණ පද්ධතිය විධිමත් පරිදි අධ්‍යයනය කර සුදුසු ක්‍රමවේදයක් හඳුන්වාදීමට අවධානය යොමු කර ඇත.

- ✓ තව ද ජීවිත සහතිකය මාර්ගගත ක්‍රමය ඔස්සේ විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට ද එතෙර සිටින ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන්ට ද අවස්ථාව ලබාදීමට ඉදිරි වර්ෂය තුල කටයුතු කරනු ඇත.

- ✓ විශ්‍රාම වැටුප් ගෙවීම් පද්ධතිය, ප්‍රා.ලේ. බිහිදොර (DS portal) , විශ්‍රාම කළමනාකරණ පද්ධතිය යන පද්ධති තුනම ඒකාබද්ධ කර PMS 2.0 නිර්මාණය කිරීම 2020 වර්ෂයේ ප්‍රධානතම අභියෝගය වේ.

- ✓ පුහුණු වැඩසටහන් සංවිධානය කර තවදුරටත් දැනුවත් කිරීම කෙරෙහි මූලික අවධානය යොමු කර ඇත. එමඟින් දැනට පවතින විශාල අතපසුවීම් හා අඩුපාඩු ප්‍රමාණයක් අවම කරගැනීමට හැකි බව අපේක්ෂා කෙරේ.

**විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්**

# 3. 2019.12.31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1.මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| ඇස්තමේන්තුව 2019 | | සටහන | සත්‍ය 2019 | සත්‍ය 2018 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | | - | |
| - | ආදායම් බදු | 1 | 0 | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | 0 | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | 0 | - | ඒසීඒ-1 |
| 30,000,000,000.00 | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 28,984,852,661 | 25,213,646,618 | ඒසීඒ-1 |
| 30,000,000,000.00 | **මුළු ආදායම් ලැබීම් (අ)** | | 28,984,852,661 | 25,213,646,618.00 | |
| | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| | භාණ්ඩාගාර අග්‍රිම | | 224,191,545,265 | 182,967,680,000 | ඒසීඒ-3 |
| | භාණ්ඩාගාරයට ආපසු ගෙවීම් | | | (1,700,000,000) | |
| | භාණ්ඩාගාර අග්‍රිම (ශුද්ධ) | | 224,191,545,265 | 181,267,680,000 | |
| | තැන්පතු | | 8,798,384 | 17,467,659 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගිණුම් | | 52,205,855 | 48,947,134 | ඒසීඒ-5 |
| | වෙනත් ලැබීම් | | 43,437,572,432 | 27,819,626,215 | |
| | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **267,690,121,936** | 209,153,721,008 | |
| | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **296,674,974,597** | 234,367,367,626 | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 516,570,000.00 | වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ | 5 | 516,109,865 | 484,669,718 | ඒසීඒ-2(ii) |
| 73,685,257.00 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 72,889,754 | 72,390,290 | ඒසීඒ-2(ii) |
| 274,042,258,643.00 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 272,363,007,932 | 224,866,916,448 | ඒසීඒ-2(ii) |
| - | පොලී ගෙවීම් | 8 | | | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 60,780 | | ඒසීඒ-2(ii) |
| 274,632,513,900.00 | **මුළු පුනරාවර්තන වියදම් (ආ)** | | **272,952,068,331** | 225,403,976,456 | |
| | **ප්‍රාග්ධන වියදම්** | | | | |
| 25,750,000.00 | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 18,058,221 | 22,547,715 | ඒසීඒ-2(ii) |
| 10,121,100.00 | ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 9,084,010 | 8,682,085 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | | - | ඒසීඒ-2(ii) |
| 2,500,000.00 | හැකියා වර්ධනය | 14 | 669,170 | 1,686,952 | ඒසීඒ-2(ii) |
| 30,830,000.00 | වෙනත් ප්‍රාග්ධන වියදම් | 15 | 30,816,675 | 30,993,314 | ඒසීඒ-2(ii) |
| 69,201,100.00 | **මුළු ප්‍රාග්ධන වියදම් (ඉ)** | | **58,628,076** | 63,910,066 | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඊ) | | **43,326,974,874** | 26,900,461,785 | |
| | **තැන්පතු ගෙවීම්** | | 8,621,606 | 14,447,230 | ඒසීඒ-4 |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 62,655,715 | 61,968,169 | ඒසීඒ-5 |
| | **වෙනත් ගෙවීම්** | | 43,255,697,553 | 26,824,046,386 | |
| | **මුළු වියදම් උ = (ආ+ඉ+ඊ)** | | **316,337,671,280** | **252,368,348,307** | |
| | 2019 දෙසැම්බර් 31 දිනට අතිරික්ත ශේෂය ඌ = (ඇ-උ) | | **-19,662,696,683** | **(18,000,980,681)** | |

1

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2019 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | සැබෑ 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 2,022,113,280 | 2,009,824,699 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම | ඒසීඒ-5 | 161,170,739 | 150,720,879 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 0 | - |
| **මුළු වත්කම්** | | **2,183,284,019** | **2,160,545,578** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| ශුද්ධ වත්කම් | | 152,636,858 | 142,163,776 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 2,022,113,280 | 2,009,824,699 |
| | | | - |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම | ඒසීඒ-4 | 8,533,881 | 8,357,104 |
| අයිරා ශේෂය | ඒසීඒ-3 | 0 | - |
| **මුළු වගකීම්** | | **2,183,284,019** | **2,160,545,578** |

පිටු අංක 01 සිට 28 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 29 සිට 54 දක්වා ඇතුළත් ගිණුම් සටහන් මිශ්‍රිත ද මෙම අවසාන ගිණුම්වලින් අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයේහි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසාන ගිණුම්වල සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බැවින් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ............................ | ............................ | ............................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන ගණකාධිකාරී |
| නම : | නම : | |
| තනතුර : | තනතුර : | නම : |
| දිනය : | දිනය : | දිනය : 26.02.2020 |
| එස්. හෙට්ටිආරච්චි<br>ලේකම්<br>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br>නිදහස් මාවත,<br>කොළඹ 07. | ඒ. ජගත් ඩී. ඩයස්<br>අධ්‍යක්ෂ ජනරාල්<br>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව<br>කොළඹ 10. | ඒ. සී. ටී. එන්. අබේසිංහ<br>ප්‍රධාන ගණකාධිකාරී<br>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,<br>මාලිගාවත්ත,<br>කොළඹ 10 |

## 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-3

**2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සටහන 2,019 රු. | 2018 රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | 0 | |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර ලාභ | 0 | |
| ආදායම් නොවන ලැබීම් | 10,528,144,946 | 217,865,934,904 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 44,020,374,397 | |
| අග්‍රිම ලැබීම් | 224,191,545,265 | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **278,740,064,608** | **217,865,934,904** |
| **අඩුකළා : මුදල් වැය කිරීම** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 548,991,644 | 498,360,720 |
| සහනාධාර සහ මාරුකිරීම් | 234,875,558,306 | 190,672,098,328 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 43,232,156,011 | |
| මූල්‍ය පිරිවැය - භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 203 | 42,105,071 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **278,656,706,164** | **191,212,564,119** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)** | **83,358,444** | **26,653,370,785** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොලී | | - |
| ලාභාංශ | | - |
| හිමිකම් ආයෝජනවල ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - |
| උපණය අයකර ගැනීම | | - |
| අත්තිකාරම් අයකර ගැනීම | 4,337,373 | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **4,337,373** | **-** |
| **අඩුකළා : මුදල් වැය කිරීම** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම | 37,469,355 | 39,867,285 |
| අත්තිකාරම් ගෙවීම | 50,974,581 | |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **88,443,936** | **39,867,285** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | **-84,106,563** | **(39,867,285)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)** | **-748,119** | **26,613,503,499** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම | 0 | - |
| විදේශීය ණය ගැනීම | 0 | - |
| ප්‍රදානයන් ලැබීම් | 0 | - |
| තැන්පතු ලැබීම් | 6,894,473 | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **6,894,473** | **-** |
| **අඩුකළා : මුදල් වැය කිරීම** | | |
| දේශීය ණය ආපසු ගෙවීම | 0 | - |
| විදේශීය ණය ආපසු ගෙවීම | 0 | - |
| තැන්පතු ගෙවීම | 6,146,354 | |
| තැන්පත් ගිණුම් හා අසහාගත වගකීම්වල වෙනස්වීම | 0 | 60,194,770 |
| රා.සේ.අ.අරමුදල හා ගුරු අරමුදල ගෙවීම | | 26,553,308,729 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **6,146,354** | **26,613,503,499** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **748,119** | **(26,613,503,499)** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ)= (උ)-(ඒ)** | **0** | **0** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **0** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **0** | **-** |

3

### 3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

**වාර්තා කිරීමේ පදනම**

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවායේ බදු වන කාලසීමාව නොසළකා, ගිණුම් කාලසීමාව තුළ මුදල් ලැබීම් අනුව හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

**3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය** රු. , 000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| | **සමාජ සංරක්ෂණ දායක මුදල්** | | | | |
| 2004.1 | මධ්‍යම රජය | 19,000,000 | 19,000,000 | 18,958,921 | 99.78% |
| 2004.2 | පළාත් සභා | 11,000,000 | 11,000,000 | 10,025,932 | 91.14% |
| 2002.01.01 | **කුලී ආදායම්** | 36,435 | 36,472 | 31,209 | 85.57% |
| | **පළාත් පාලන අරමුදල්** | | | | |
| 8186 | ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල | 323,440 | 323,440 | 387,707 | 119.87% |
| - | පලාත් පාලන සේවා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල | - | - | 22 | - |
| - | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල | - | - | 352 | - |
| - | පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල | - | - | 208,885 | - |

**3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය** රු. , 000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | සත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 254,834,000 | 274,632,575 | 272,952,071 | 99.4% |
| ප්‍රාග්ධන | 64,000 | 69,201 | 58,628 | 84.7% |

**3.7. මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | සත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | ජාතික ප්‍රතිපත්ති ආර්ථික කටයුතු අමාත්‍යාංශය (104) | DO Trainee Salary | 960 | 960 | 870 | 91% |
| 02 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව (309) | ගෙවල් කුලී | 3,117 | 3,117 | 3,117 | 100% |

**3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

රු. ,000

| **වත්කම් කේතය** | **කේත විස්තරය** | **2019.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ශේෂය** | **2019.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව ශේෂය** | **ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත** | **ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම** |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ද්‍රව්‍යයන් | 581,259 | 581,259 | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 242,449 | 242,449 | - | 100% |
| 9153 | ඉඩම් | 1,198,405 | 1,198,405 | - | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

## 3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

My No. ඩබ්ලිව්ඩබ්/ඩී/ඩීඑෆ්/02/20/13    Your No.    Date 2020 ජූලි 14 දින

අධ්‍යක්ෂ ජනරාල්
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩිත වාර්තාව.

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ ඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ සහතිකවීමක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණනාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, තමහි මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින්, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

4

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සකස් කිරීමේදී වෙනත් ලැබීම් සහ වෙනත් ගෙවීම් යටතේ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සහ ගුරු වැන්දඹු අනත්දරු අරමුදල යන අරමුදල් දෙක යටතේ වර්ෂය තුළ එකතු කරන ලද ආදායම් රු.43,437,572,433 ක් සහ වර්ෂය තුළ කරන ලද ගෙවීම් රු.43,255,697,553 ව ක්ද ඇතුළත් කර තිබුණි.එසේ වුවද මෙම අරමුදල් දෙක සඳහා වෙන වෙනම වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලබන බවද නිරීක්ෂණය විය.

මෙම අරමුදල් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් අනුව ක්‍රියාත්මක කිරීම හා දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශ යටතේ ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ නැවත සමාලෝචනය කළ යුතු බවත් නිරීක්ෂණය වේ.

කෙටුම්පත් වාර්තාව සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මා වෙත ඉදිරිපත් කරන ලද පිළිතුර අනුව රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 07/2006 අනුව මහා භාණ්ඩාගාරය විසින් ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සමාලෝචනය සඳහා පත්කරනු ලැබූ විශේෂ කමිටුව මඟින් ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට අදාළ පනත් සංශෝධනය කර වසා දැමිය යුතු බවට යෝජනා කර තිබූ බව දක්වා තිබුණද ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත නිරීක්ෂණයන් කෙරේ

**1.6.2.1 මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්.**

(අ) ශේෂ පිරික්සුම් අනුව වර්ෂය සඳහා ආදායම් නොවන ලැබීම් වටිනාකම රු.10,182,139,721 ක් වූ නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව එම වටිනාකම රු. 10,528,144,946 ක් වූයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් රු.346,005,225 ක් වැඩියෙන් දක්වා තිබුණි..

(ආ) ශේෂ පිරික්සුම් අනුව වර්ෂය තුළ වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද මුදල රු.44,253,207,827 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් ලෙස රු.44,020,374,397 ක් දක්වා තිබීම හේතුවෙන් රු.232,833,430 ක් අඩුවෙන් දක්වා තිබුණි..

ඉහත (අ) සහ (ආ) හි වෙනස්කම් හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයෙහි ලැබීම් රු. 113,171,796 ක් අඩුවෙන් දැක්වුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

5

(ඇ) ශේෂ පිරික්සුම හා ඊසීඒ 2(ii) ආකෘතිය අනුව දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වෙනුවෙන් දරන ලද වියදම රු. 598,352,726 ක් වුවද අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව එම වටිනාකම රු.548,991,644 ක් වූ ලෙස දැක්වීමෙන් රු. 49,361,082 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ශේෂ පිරික්සුම හා ඊසීඒ 2 (ii) වියදම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් සහතාධාර සහ මාරුකිරීම් වෙනුවෙන් රු. 234,715,971,320 ක් මුදලින් වියකර තිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර තිබූ එම වටිනාකම රු. 234,875,558,306 ක් වූයෙන් රු.159,586,986 ක් වැඩියෙන් සටහන් කර තිබුණි.

(ඉ) ශේෂ පිරික්සුම අනුව වෙනත් ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් රු. 43,262,955,585 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම වටිනාකම රු. 43,232,156,011 ක් ලෙස ඇතුළත් කර තිබූ නිසා රු. 30,799,574, ක් අඩුවෙන් දක්වා තිබුණි.

**1.6.2.2 ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය**

(අ) (i)ශේෂ පිරික්සුම අනුව වර්ෂය තුළ අත්තිකාරම් "බී" ගිණුම යටතේ අයකර ගැනීම් රු .40, 062,582 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර තිබූ එම වටිනාකම රු. 4, 337, 373 ක් වූ නිසා අත්තිකාරම් ලැබීම් අඩුවෙන් සටහන් කර තිබූ වටිනාකම රු. 35,725,209 ක් වී තිබුණි. තවද ඊසීඒ 5 ප්‍රකාශය අනුව අත්තිකාරම් මුදලින් ලැබීම 4,329,724 ක් ලෙසද ද භාණ්ඩාගාර මුද්‍රිත අනුව ලැබීම් රු.40,073,878 ක් ලෙසද සඳහන් වී තිබූ බැවින් මෙම සංඛ්‍යා එකිනෙකට පරස්පර වන බව නිරීක්ෂණය විය

(ii) ශේෂ පිරික්සුම අනුව වර්ෂය තුළ අත්තිකාරම් "බී" ගිණුම යටතේ ගෙවීම් රු 50,983,977 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව එම ගෙවීම් රු. 50,974,581 ක් ලෙස ඇතුළත් කර තිබීම නිසා රු. 9,396 ක් අඩුවෙන් දක්වා තිබූ බව නිරීක්ෂණය විය. තවද ඊසීඒ 5 ප්‍රකාශය අනුව එම වටිනාකම රු. 50.977,977 ක් ද භාණ්ඩාගාර මුද්‍රිත අනුව රු. 51,343,912 ක්ද වී තිබූ බැවින් මෙම සංඛ්‍යා එකිනෙකට පරස්පර වන බව නිරීක්ෂණය විය.

(ආ) ශේෂ පිරික්සුම අනුව වර්ෂය තුළ භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් වටිනාකම රු. 40,569,854 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව එම වටිනාකම රු.37,469,355 වී තිබුණි. ඒඅනුව භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම් රු. 3,100,499 ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි

### 1.6.2.3 මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ.

ශේෂ පිරික්සුම හා භාණ්ඩාගාර මුද්‍රිත අනුව වර්ෂය තුළ තැන්පතු මුදලින් ලැබීම් වල වටිනාකම රු. 8,798,384 ක් වූ නමුත් අරමුදල් ප්‍රවාහයට එම වටිනාකම රු.6,894,473 ක් ලෙස 1,903,911 ක් අඩුවෙන් දක්වා තිබුණි.

එසේම තැන්පතු ගෙවීම් ශේෂ පිරික්සුම හා භාණ්ඩාගාර මුද්‍රිත අනුව රු. 8,621,606 ක් වූ නමුත් අරමුදල් ප්‍රවාහ ප්‍රකාශයට රු. 6,146,354 ක් ලෙස රු. 2,475,252 ක් අඩුවෙන් දක්වා තිබුණි.

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කෙටුම්පත් වාර්තාව සඳහා මා වෙත ලබා සඳහා ලද පිළිතුර අනුව දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී භාරස් සටහන් මඟින් කරන ලද ලැබීම් හා ගෙවීම් ඉවත් කර මුදල් ප්‍රවාහ ගණනය කිරීම මෙම වෙනස්කම් සඳහා හේතු වී තිබුණි.

## 2- මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

(අ) ආදායම් සංකේත අංකය 20:04:01:00 (මධ්‍යම රජය)

පහත නිරීක්ෂණයන් කෙරේ

I. සමාලෝචිත වර්ෂය තුළදී රු .42,736,960 ක් ආදායමෙන් අපසු ගෙවා තිබූ අතර එම ගෙවීම්වලින් රු .41,310,201 ක් සනාථ කර ගැනීම සඳහා 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 1 (අ) වගන්තිය ප්‍රකාරව අදාල ආයතනවලින් භාර නිවේදන ලබා ගෙන නොතිබුණි.

II. සමාජ සංරක්ෂණ දායක මුදල් (වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනාථදරු දායක මුදල්) මධ්‍යම රජයට හා ආදායම් ගිණුම් යටතේ දායක වී තිබෙන නිලධාරීන් සම්බන්ධ දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. එබැවින් සමාජ සංරක්ෂණ ක්‍රමයෙන් ප්‍රතිලාභ ලැබීමට නියමිත සාමාජික සංඛ්‍යාව පිළිබඳ තොරතුරු නොමැති වීම තුල ඒ අනුව හිමිවන වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනාථදරු විශ්‍රාම වැටුප් හා දායක මුදල් ආපසු ගෙවීම් යනාදී ප්‍රතිලාභ හිමිකැන්වීමේදී දායක මුදල් නිශ්චිතව, අඛණ්ඩව ලැබුණේද යන්න දෙපාර්තමේන්තුව තුලින් සනාථ කර ගැනීමට නොහැකි වී තිබුණි.

කෙටුම්පත් වාර්තාව සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මා වෙත ලබා දුන් පිළිතුර අනුව 2017 ඔක්තෝබර් මාසයේ සිට සියලු රාජ්‍ය නිලධාරීන්ගේ තොරතුරු මූලික තොරතුරු මාර්ගගත දත්ත පද්ධතියක් (on line) ඇතුලත් වැඩසටහනක් හඳුන්වා දී තිබුනද රාජ්‍ය අංශයේ අනෙකුත් ආයතනවල සහයෝගය නොමැති වීම නිසා එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම අකර්මන්‍ය වී ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

7

(ආ) ආදායම් සංකේත අංකය 20:04:02:00 - සමාජ සංරක්ෂණ දායක මුදල් - (පළාත් සභා)

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

I. සමාජ සංරක්ෂණ දායක මුදල් ලැබීම් හා හිඟ දායක මුදල් ආයතන අනුව මෙන්ම දායකයන් අනුව, නිශ්චිතව හඳුනාගත හැකි වන පරිදි සුදුසු දත්ත පද්ධතියක් සකස් කර නොතිබුණු අතර පළාත් පාලන ආයතන විසින් ශ්‍රේෂණය කරන ලද දායක මුදල් ආදායම් ලෙසද , පළාත් පාලන ආයතන විසින් හිඟ ආදායම් ලෙස වාර්තාකර තිබූ වටිනාකම් හිඟ ආදායම් ලෙසද ගිණුම් ගත කර තිබුණි ඒ .හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී මෙම ශීර්ෂය සඳහා රු: 808,293,002 ක් වූ හිඟ ආදායමේ නිවැරදිභාවය තහවුරු කර ගැනීමට නොහැකි වූ අතර එම වටිනාකම් දායකයා අනුව වෙන්කර ගැනීමටත් නොහැකි වී තිබුණි.

II. 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.2 වගන්තිය ප්‍රකාරව පළාත් සභා විසින් සියළුම කාර්යාලවල දායක මුදල් වෙනුවෙන් එක් චෙක්පතක් නිකුත් කරන්නේ නම් සෑම මසකම අයකිරීම් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී එම චෙක්පත් එවීමේදී දින 14 සිට දින 94 දක්වා ප්‍රමාද වූ අවස්ථා නිරීක්ෂණය විය.
අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කෙටුම්පත් වාර්තාව සඳහා මා වෙත ලබා දුන් පිළිතුරු, දායක මුදල් අනුව ගෙන්වා ගැනීමට දින 20 දක්වා කල් ලබා දීම සිදුකර ඇති බවත් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, මුදල් කොමිෂන් සභාව වෙතද මෙම ප්‍රමාදය පිළිබඳව දැනුවත් කර ඇති බවත් මෙම මුදල් නිසි පරිදි දෙපාර්තමේන්තුව වෙත එවීම අනෙකුත් සියළු රාජ්‍ය ආයතනයන්හි වගකීම වන බවත් දක්වා තිබුණි.

III. කැපුවම් චෙක්පත් මගින් දායක මුදල් එවනු ලබන ආයතන 05 ක් විසින් ඉදිරිපත් කරන ලද රු .756,996 ක් වටිනා චෙක්පත් 07 ක් විවිධ හේතු මත 2019 මැයි 24 සිට 2019 සැප්තැම්බර් 10 දක්වා ආපසු හරවා යවා තිබුණි. එහෙත් 2019 මැයි 14 වන විට වසරකට වැඩි කාලයක් ගත වී ඇතත් එම දායක මුදල් නැවත ලැබී නොතිබුණු අතර එය වර්ෂය අවසානයේ හිඟ ආදායම් ලෙසද ඇතුලත් කර නොතිබුණි.

## 2.2 වියදම් කළමනාකරණය

නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 04 කට සහ මූලධන වැය විෂයයන් 06 කට අදාළව ඉතිරිවීම් වටිනාකම් පිළිවෙලින් රු.7,684,757 ක් හා රු.10,032,998 ක් වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 91 දක්වා පරාසයක පැවතුණු බැවින් ප්‍රතිපාදන ප්‍රශස්ත ලෙස උපයෝජනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 04 ක් සඳහා වෙන් කර ගන්නා ලද රු.46,859,000 ක ප්‍රතිපාදනයන්ට අමතරව මු.රෙ 66/69 ප්‍රතිපාදන රු 16,365,000ක් මාරු කර ගැනීමෙන් පසු රු. 8,006,579 ක ප්‍රතිපාදන ඉතිරිව පැවතුණි.

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

සමාලෝචිත වර්ෂයේ වැය විෂය අංක 253 -1-1.1002 හා වැය විෂය අංක 253 -1-2.1502 සඳහා ඉතිරිය වටිනාකම් පිළිවෙලින් රු.180,904 ක් සහ රු. 1,648,675,880 ක් ද බැරකම් වටිනාකම් පිළිවෙලින් රු 207,948 ක් සහ රු.2,424,690,280 ක්ද වුවයෙන් ප්‍රතිපාදන ඉක්මවන ලද බැරකම් වටිනාකම් රු.776,041,400 වී තිබුණි.

## 2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නිරීක්ෂණය

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජ වාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මු.රෙ. 371(ආ) | 142,000 | දෙනු ලබන අතුරු අග්‍රිම එය දෙන ලද කාර්ය නිමකල විගසම පියවිය යුතු වුවද අවස්ථා 03 කදී ලබාගත් වටිනාකම රු: 142,000 ක් වූ අතුරු අග්‍රිම දින 09-52 ක කාල පරාසයක් ප්‍රමාද කර පියවා තිබූ බව නියදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජ වාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>(i) xiv පරිච්ඡේදයේ 2 වගන්තිය | | රාජකාරි ගමන ආරම්භ කරන ස්ථානය සේ සැලකිය යුත්තේ නිලධාරියා වැඩකරන ස්ථානය හෝ නම් පදිංචි නිවස යන දෙකෙන් ගමනාන්තයට ආසන්නම ස්ථානයේ සිට වුවද එසේ නොමැතිව ගමනාන්තයට දුර ස්ථානයක සිට ගමන ආරම්භ කර සංයුක්ත දීමනා හා ගමන් වියදම් ලබාගෙන ඇති අවස්ථා 3 ක් නිරීක්ෂණය විය. |
| (ii) xiv පරිච්ඡේදයේ 4 වගන්තිය | | සංයුක්ත දීමනා ගෙවීම සඳහා ගමන් කළයුතු අවම දුර කි.මීටර් 11 කට (සැතපුම් 07 කට) වැඩි විය යුතු වුවත් ඊට පටහැනි ලෙස ගෙවීම් කර ඇති අවස්ථා නියැදි විගණන පරීක්ෂා වලදී නිරීක්ෂණය විය |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

10

| | |
|---|---|
| (iii) xiv පරිච්ඡේදයේ 28.6 වගන්තිය | ප්‍රමාද වී ඉදිරිපත් කරන ගමන් වියදම් සඳහා ආයතන සංග්‍රහයේ ප්‍රකාරව අඩුකිරීම් කොට ගෙවීම් කල යුතු වුවද, එපරිදි අඩුකිරීම් කර නොතිබුණි. |

(ඇ) විශ්‍රාම වැටුප් චක්‍රලේඛ

---

| | |
|---|---|
| (i) 2014 අප්‍රේල් මස 07 වන දිනැති සහ අංක 01/2011 (සංශෝධන) දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | සැම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම මාසිකව විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා ක්‍රමවත් පාලන ගිණුමක් පවත්වාගෙන යාම අනිවාර්ය කර තිබේ. නියැදි පරීක්ෂණය අනුව කොළඹ, පන්නල සහ නාරම්මල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එපරිදි පාලන ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ii) 2009 ජනවාරි 07 දිනැති විශ්‍රාම වැටුප් 1/2009 චක්‍රලේඛයේ 08 ඡේදය | ආබාධිත දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීමේ කටයුතු අධීක්ෂණය පූර්ණ වශයෙන්ම ග්‍රාම නිලධාරීන්ට පැවරිය යුතුය. නිසි රැකවරණය සැලසෙන බවට ග්‍රාම නිලධාරී වගබලා ගත යුතු අතර ත්‍රෛමාසික වාර්තාවක් ගොනුවට ඇතුලත් කල යුතු වුවත් නියැදි පරීක්ෂාවේදී කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. |

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE



| | |
|---|---|
| (ඇ) 2019 මැයි 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/2019 04 වන වගන්තිය | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් සකස් කර ඇති රෙගුලාසි ඇතුලත් අත්පොතේ 292 නියෝගය ප්‍රකාරව ආණ්ඩුවෙන් විශ්‍රාම වැටුපක් ලබමින් සිටි පුද්ගලයෙකුගේ මරණයක් ලියාපදිංචි කල විට ඒ බව බී 73 දරන පෝරමයේ ලියා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් හෝ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙත ද කොළඹ නගරයේ වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරුන් නම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ද නොපමාව වාර්තා කල යුතුය. ඉහත බී 73 වාර්තාවේ පිටපතක් තමන් වෙත සතියකට වරක් එවන ලෙසත් අදාල ප්‍රාදේශිය ලේකම්වරුන් සම පාලනයේ කටයුතු කරන රෙජිස්ට්‍රාර්වරු හා වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරුන්ට උපදෙස් ලබාදිය යුතුව තිබුණද නියැදි පරීක්ෂාණ වලදී හෙළිදරව් කර ගත පරිදි නාරම්මල, කුරුණෑගල, යටිනුවර, ගනේවත්තකෝර්ලය යන ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) විගණනයට ඉදිරිපත් කල රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට වැඩ ස්ථාන මාරු කර ඇති ,සේවය අතහැර ගොස් ඇති හා මියැ වී ගිය නිලධාරීන්ගෙන් වර්ෂ 5ට වැඩි කල සිට පැවති නිලධාරීන් 12 ගෙන් අයවිය යුතු ශේෂය රු. 718,350 ක් වී තිබුණු අතර මෙම ශේෂ 2019 දෙසැම්බර් 31 දක්වා නිරවුල් කරගෙන නොතිබුණි.

(ආ) 2019 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ශේෂය, සේවල ශේෂ වර්ගීකරණ සාරාංශ අනුව හා පාලන ගිණුම අතර රු. 315,738 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම

12

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

වෙනස තුල අඩංගු වූ එකතුව රු: 85,877 ක් වසර 7 කට වඩා පැරණි ශේෂ වූ අතර සමාලෝචිත වර්ෂය තුලදීද එම ශේෂ නිරවුල් කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

---

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

ටී.පී.අයි පද්මිණී

සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ලේ/වැඩ/ඕ/ඕකඔ/02/20/14 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 ජූලි 31 දින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

**පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනාථ දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනාථ දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 23 වගන්තිය යටතේ පනවන ලද 1986 පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනාථ දරු විශ්‍රාම වැටුප් අරමුදලේ නියෝග අංක 6 සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවට සභාගත කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01න් බැහැරව මුදල් පදනම මත සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබූ පෙර වර්ෂවලට අදාල දායක මුදල් රු. 22,194 ක් පමණක් ගිණුම් ගතකර තිබූ අතර, තවදුරටත් හිඟ හිටි ඇති දායක මුදල් ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1985 අංක10 දරන පළාත් පාලන සේවා පනතේ 14 වගන්තිය ප්‍රකාරව පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයින්ගේ වැන්දඹු පුරුෂයන්ට සහ දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීමේ අරමුණින් මෙම අරමුදල පිහිටුවා තිබුණි. එසේ වුවද, 1993 වර්ෂයේ පළාත් රාජ්‍ය සේවය ස්ථාපිත කිරීමෙන් පසු බඳවා ගන්නා ලද පළාත් රාජ්‍ය නිලධාරීන්හට රාජ්‍ය නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් හා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිවීම නිසා 1993 සැප්තැම්බර් 03 දිනෙන් පසු මෙම අරමුදලට නව සමාජිකයින් එකතු වී නොතිබුණි.

එදිනෙන් පසු මියගිය සාමාජිකයින්ගේ වැන්දඹු පුරුෂයන්ට සහ දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීමට ප්‍රමාණවත් තරම් මුදල් අරමුදලට එකතු නොවීම හේතුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන සලසාගෙන අරමුදලේ වියදම් සිදුකර තිබුණි. ප්‍රවර්ථන වර්ෂයේ එලෙස දරන් ලද වියදම් රු 65,329,870 ක් විය. මෙලෙස අරමුදල අක්‍රීය තත්වයට පත්වීම සම්බන්ධව ගිණුම් සටහන් මගින් හෙළිදරව් කිරීම කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මකසාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදලේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙමෙහුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ සහතිකවීමක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන සහතික කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩබ්ලිව්සීඒ/ඩී/ඩීටීඩී/02/20/15 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 අගෝස්තු 24 දින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

**පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

---

1.1 තත්ත්වාගණනය කළ මතය

---

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන සේවා ආඥා පනතේ (264 අධිකාරියේ) 62 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවට සභාගත කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2 සංශෝධනය කළ මතය සඳහා පදනම

---

(අ) රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි ප්‍රකාරව අරමුදල විසින් උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී පූර්ව වර්ෂවලට අදාලව හා සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබූ දායක මුදල්, මුදල් පදනම මත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබුණි.

(ආ) 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 15 වගන්තිය ප්‍රකාරව පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීමේ අරමුණින් මෙම අරමුදල පිහිටුවා තිබුණි. එසේ වුවද, 1993 වර්ෂයේ පළාත් රාජ්‍ය සේවය ස්ථාපිත කිරීමෙන් පසු බඳවා ගන්නා ලද පළාත් රාජ්‍ය නිලධාරීන්හට රාජ්‍ය නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිවීම නිසා 1993 සැප්තැම්බර් 03 දිනෙන් පසු මෙම අරමුදලට නව සාමාජිකයින් එකතු වී නොතිබුණි.

2011 වර්ෂයෙන් පසු පළාත් පාලන සේවයේ විශ්‍රාමිකයින්ට විශ්‍රාම වැටුප් ගෙවීමට ප්‍රමාණවත් තරම් මුදල් අරමුදලට එකතු නොවීම හේතුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන සලසාගෙන අරමුදලේ වියදම් සිදුකර තිබුණි. ප්‍රවර්තන වර්ෂයේ එලෙස දරන ලද වියදම් රු. 1,054,552,738 ක් විය. මෙලෙස අරමුදල අක්‍රිය තත්වයට පත්වීම සම්බන්ධව ගිණුම් සටහන් මගින් හෙළිදරව් කිරීම කර නොතිබුණි.

(ඇ) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් පාලන ආයතන 287 කින් ලැබිය යුතු දායක මුදල් රු. 1,148,538,339 ක් විය.එම ශේෂය සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබුණු විශ්‍රාම වැටුප් දායක මුදල් ලේඛනවලට අනුව පළාත් පාලන ආයතන 81 කින් ලැබිය යුතු රු. 463,770,831 ක දායක මුදලින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේදී ලැබී නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

NAOSL ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

NAOSL ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අයහපත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පෙන්/ඩී/ඩීඑම්/02/20/19 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 ජූලි දින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

**පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 23 වගන්තිය යටතේ පනවන ලද 1985 පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ නියෝග අංක 6 සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවට සභාගත කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 01 සඳහා උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දී පෙර වර්ෂවලට අදාලව ලැබී තිබූ ආයක මුදල් රු. 174,558 ක් මුදල් පදනම මත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබූ අතර, තවදුරටත් හිඟ හිටි ඇති ආයක මුදල් ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 16 වගන්තිය ප්‍රකාරව පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයින්ගේ වැන්දඹුවන්ට සහ දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීමේ අරමුණින් මෙම අරමුදල පිහිටුවා තිබුණි. එසේ වුවද, 1993 වර්ෂයේ පළාත් රාජ්‍ය සේවය ස්ථාපිත කිරීමෙන් පසු බඳවා ගන්නා ලද පළාත් රාජ්‍ය නිලධාරීන්හට රාජ්‍ය නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනාථ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිවීම නිසා 1993 සැප්තැම්බර් 03 දිනෙන් පසු මෙම අරමුදලට නව සාමාජිකයින් එකතු වී නොතිබුණි.

එදිනෙන් පසු මියගිය සාමාජිකයින්ගේ වැන්දඹුවන්ට සහ දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීමට ප්‍රමාණවත් තරම් මුදල් අරමුදලට එකතු නොවීම හේතුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන සලසාගෙන අරමුදලේ වියදම් සිදුකර තිබුණු අතර, ප්‍රවර්තන වර්ෂයේ එලෙස දරන ලද වියදම රු. 922,080,202 ක් විය. මෙලෙස අරමුදල අක්‍රීය තත්ත්වයට පත්වීම සම්බන්ධව ගිණුම් සටහන් මගින් හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

3

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

4

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

මගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව නැත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

5

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ඩීඑම්/ඩී/ඩීඑම්/02/20/20 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 ජූලි 31 දින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

**ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1953 අංක 44 දරන පාර්ලිමේන්තු ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් ආඥා පනතේ 5 හා 9 වගන්ති ප්‍රකාර පනවන ලද රෙගුලාසිවල 6(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවට සභාගත කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 1953 අංක 44 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත් නියෝග අංක 04 ප්‍රකාරව ගුරු වැන්දඹු අනන්දරු දායක මුදල්වලින් අරමුදලක් පවත්වාගෙන එමගින් ගුරු වැන්දඹු අනන්දරු විශ්‍රාම වැටුප් ගෙවීම කළ යුතුයි. එසේ වුවද දායක මුදල් රැස් කිරීම හා ගෙවීම කිරීම සඳහා අරමුදල වෙනුවෙන් වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබූ අතර, දායක මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ බැංකු ගිණුමට රැස්කර තිබීම හා උක්ත වියදම් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ ගෙවීම කිරීමක් සිදු කර තිබුණි . මෙලෙස වර්ෂය තුළදී ගෙවන ලද වැන්දඹු අනන්දරු දායකත්ව වටිනාකම සහ අරමුදල අක්‍රීය තත්ත්වයට පත්වීම සම්බන්ධව ගිණුම් සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) දායක මුදල් හා වෙනත් ආදායම් රැස් කිරීම සහ දායක මුදල් ආපසු ගෙවීම සඳහා අවසන් ගිණුමෙහි භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම පවත්වාගෙන ගොස් තිබුණද, 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ නිරූපණය කර තිබූ රු. 1,039,177,078 ක භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ශේෂය තාවකාලික ශේෂයක් බව නිරීක්ෂණය විය.

(ඇ) පිරිවෙන් හා පෞද්ගලික /උපකෘත පාසැල්වල ගුරුවරුන්ගෙන්, වැන්දඹු /වැන්දඹු පුරුෂ හා අනන්දරු දායක මුදල් ලෙස සියයට 6 ක් සහ දායක විශ්‍රාම වැටුප් අරමුදල් දායකය ලෙස සියයට 6 ක් වශයෙන් අරමුණු 2 ක් යටතේ දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත මාසිකව ප්‍රේෂණය කළ යුතුයි. එසේ වුවද අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගිණුම් සාරාංශ මගින් 2019 වර්ෂයේ දී පළාත් 3 ක් සඳහා බැර කරන ලද රු.137,818,157 ක් වූ මුදල කුමන නිලධාරීන්ගේ කවර දායකත්වයක් ද හඳුනාගත නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

3

NAOSL
ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරමි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

ජාතික විගණන කාර්යාල
NATIONAL AUDIT OFFIC

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව නැත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

5

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්/පීඩී/ඩී/ඩබ්පී / 02/20/21    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2020 සැප්තැම්බර් 11

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

**රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩිත වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය ව්‍යාවර්තනය**

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතේ (621 අධිකාරියේ) 24(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවර්තනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

1.2 මතය විකරණය සඳහා පදනම

---

(අ) රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 7 ඡේදය ප්‍රකාරව ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම් ගත කල යුතු වුවද එයට පටහැනිව වාර්ෂික ගිණුම්වලට ඇතුලත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.4 (ඕ) (ii) යටතේ අරමුදලට ලැබෙන මුදල්, මුදල් පදනම මත ගිණුම්ගත කරන බවට හෙළිදරව් කිරීම කර තිබුණි .

(ආ) වාසික ගිණුම් සාරාංශ මගින් විවිධ රාජ්‍ය ආයතන විසින් අරමුදලේ බැංකු ගිණුමට සිදුකරන ලද හර හා බැර කිරීම් වලින් හඳුනා නොගත් ශේෂ නිරවුල් කරන තෙක් ගැලපුම් ගිණුමකට ඇතුළත් කර තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ හර ශේෂය රු. 29,807,958 ක් වුවද, ඊට අදාල උපලේඛනය අනුව ශේෂය රු. 24,517,312 ක් වුයෙන් රු. 5,290,646 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) අරමුදලේ දායකයින්ගේ ගෙවීම් ගිණුම් පවත්වාගෙන යාම සඳහා මාර්ගගත (on line) දත්ත පද්ධතියක් හඳුන්වා දී තිබුණද එය විධිමත් පරිදි ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ශේෂ පත්‍රයේ දක්වා තිබූ අනිවාර්ය දායක මුදල් ගිණුමේ ශේෂය රු. 26,748,086,766 ක්ද, ස්වේච්ඡා දායක මුදල් ගිණුමේ ශේෂය රු. 41,481,802 ක්ද, රජයේ දායක මුදල් ගිණුමේ ශේෂය රු. 41,456,600,115 ක්ද සම්පූර්ණයෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

2

අරමුදල මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ප්‍රකාශනය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතේ (621 අධිකාරය) | |
| (I) 16 (1) (අ) සහ 20 (අ) වගන්ති | අකාර්යක්ෂමභාවය, විෂමාචාරය යන හේතුව මත දායකයකු සේවයෙන් පහ කරනු ලබන විට හෝ අරමුදලේ දායකයකු රාජ්‍ය සේවයෙහි විශ්‍රාම වැටුප් හිමි ධුරයකට පත්කරනු ලැබූ විට රජයේ ප්‍රසාද මුදල් සම්බන්ධයෙන් ලැබුණු පොලියත් සමඟ ඒ දායකයාගේ ගිණුමට ආණ්ඩුව විසින් බැර කරන ලද ප්‍රසාද මුදල් ප්‍රමාණය අරමුදලින් එකාබද්ධ අරමුදලට නැවත ගෙවිය යුතු වුවත් 2019 වර්ෂයට අදාල රු. 318,660,995 ක් වූ නොගෙවූ රජයේ ප්‍රසාද මුදල් හා පොලිය උපචිතව පැවතුණි. |
| (II) 25 වගන්තිය | එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දෙසැම්බර් 31 දිනට සාමාජික ගිණුම්වල ඇති ශේෂයන් දායකයින් වෙත දැනුම් දිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

4

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

3.2 කාර්යසාධනය

2019 ජනවාරි 01 දිනට නොගෙවූ අයදුම්පත් 592 ක් තිබූ අතර වර්ෂය තුළ අරමුදලේ සාමාජිකයින් විසින් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ඉදිරිපත් කල අයදුම්පත් සංඛ්‍යාව 6,435 ක් විය. ඒ අතුරින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයදුම්පත් 5,070 ක් සඳහා රු. 308,893,693 ක් ගෙවීම් කර තිබූ අතර අයදුම්පත් 434 ක් ප්‍රතික්ෂේප කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

5

**4. කාර්ය සාධන දර්ශක**

**4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක ( ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)**

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුව | | |
|---|---|---|---|---|---|
| | | | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| නව විශ්‍රාම වැටුප් ප්‍රදානය | විශ්‍රාම වැටුප් ප්‍රදානය | විශ්‍රාම වැටුප් ප්‍රදාන ලබාගත් විශ්‍රාමිකයින් ගණන | - | 89.03% | - |
| | වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදානය | | - | 83.68% | - |
| සංශෝධන ගෙවීම් | විශ්‍රාම වැටුප් සංශෝධන | ගෙවූ සංශෝධිත විශ්‍රාම වැටුප් ප්‍රමාණය | - | - | 31.31% |
| පාරිතෝෂික හා වෙනත් ගෙවීම් | මරණ පාරිතෝෂිකය | | - | 88.90% | - |
| | ආබාධිත විශ්‍රාම වැටුප් | | - | - | 62.84% |
| | සත්කාර පියස | සම්මුඛ පරීක්ෂණයට කැඳවන ලද සංඛ්‍යාව | - | 89.03% | - |
| මාසික විශ්‍රාම වැටුප් | මාසික විශ්‍රාම වැටුප් සිවිල් | මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන | 100% | - | - |
| | පාරිතෝෂික ගෙවීම හා ණය වාරික | මාසිකව ප්‍රතිලාභ ලද විශ්‍රාමිකයින් ගණන | 96% | - | - |
| සමාජ සුභසාධන | ත්‍රිවිධ හමුදා සහ පොලිස් | මාසිකව ප්‍රතිලාභ ලද පුද්ගලයින් ගණන | 96.39% | - | - |
| වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම | මාසිකව ප්‍රතිලාභ ලද පුද්ගලයින් ගණන | 100% | - | - |
| වැන්දඹු හා අනත්දරු දායක මුදල් අදායම : ආදායම් රැස් කිරිම | මධ්‍යම රජය | මාසික අදායම | 99.78% | - | - |
| | පළාත් සභා | මාසික අදායම | 91.14% | - | - |
| | ගුරු වැන්දඹු අනත්දරු | මාසික අදායම | 147.4% | - | - |
| වැන්දඹු හා අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම. | සිවිල් | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | - | 76.53% | - |
| | හමුදා | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 122.91% | - | - |
| | ගුරු වැන්දඹු අනත්දරු | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 100% | - | - |

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|---|
| | | | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල | රා.සේ.අ.අ. සාමාජිකයින් සංඛ්‍යාව | වාර්ෂික නව සාමාජිකයින් සංඛ්‍යාව | 143.1% | - | - |
| | දායක මුදල් ගෙවීම් | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | - | - | 70.38% |
| | දායක මුදල් ලැබීම් | මාසික දායකත්වය 8% හා 12% | 122% | - | - |
| ධාරිතා සංවර්ධනය | ලිපිගොනු කළමනාකරණය | ලිපිගොනු යාවත්කාලීන කිරීම | 100% | - | - |
| | Friday Forum වැඩසටහන පැවැත්වීම | මාසයකට එක වැඩසටහනක් බැගින් නිම කිරීම | - | - | 50% |
| ඵලදායිතාවය | සංවර්ධන කාර්යයන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම | දෙපාර්තමේන්තු නිලධාරීන් පුහුණු කිරීම | - | 75% | - |
| | ඵලදායිතාවය සඳහා අවශ්‍ය පුහුණු සැසි පැවැත්වීම | සංවර්ධන නිලධාරීන් | - | 75% | - |
| පද්ධති සංවර්ධන කටයුතු | PMS නඩත්තු කටයුතු | PMS නිවැරදි ක්‍රියාකාරිත්වය | 100% | - | - |
| | ස්කෑන් යන්ත්‍ර මිලදී ගැනීම | ස්කෑන් යන්ත්‍ර ගණන | 100% | - | - |
| | Firewall ගිවිසුම යාවත්කාලීන කිරීම | අවසන් ගිවිසුම | 100% | - | - |
| | හමුදා අංශය සඳහා නව තොරතුරු පද්ධතියක් සඳහා තොරතුරු රැස් කිරීම | නව තොරතුරු පද්ධතිය | 100% | - | - |
| | වැන්දඹු හා අනත්දරු අංශයට නව පද්ධතියක් සඳහා වන අවශ්‍යතාවය පිළිබඳ තොරතුරු ලබාදීම | නව තොරතුරු පද්ධතිය | 100% | - | - |

| ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුව | | |
|---|---|---|---|---|---|
| | | | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| ආයතනික පරිසරය වැඩි දියුණු කිරීම | තුන්වන මහලේ පාලන අංශය ආශ්‍රිත පෙදෙස නවීකරණය කිරීම | 2019 වර්ෂය තුල සියළුම ව්‍යාපෘති අවසන් කිරීම | 100% | - | - |
| | තුන්වන මහලේ භෝජනාගාරය පෙදෙස පුළුල් කර නවීකරණය කිරීම | | 100% | - | - |
| හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම | සිවිල් | විශ්‍රාමිකයින් ගණන | - | 76% | - |
| | හමුදා | | - | - | 32% |
| | විෂමතා | | - | - | 39% |
| විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම | සිවිල් විශ්‍රාම වැටුප් | විශ්‍රාමිකයන් හා වැන්දඹුවන් සංඛ්‍යාව | *179% | - | - |
| | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් | | 104.76% | - | - |
| | විශ්‍රාම වැටුප් සංශෝධන | | **840% | - | - |
| | හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම් | | 100.7% | - | - |

* මහකොමසාරිස් කාර්යාල මගින් නතර කරන ලද විශ්‍රාම වැටුප් දේශීය බැංකු මගින් ගෙවීම් කිරීම ආරම්භ කිරීම හේතුවෙන් වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද 300ක් වන වාර්ෂික ප්‍රතිලාභීන් සංඛ්‍යාව 538 ක් දක්වා වැඩිවී ඇත. ප්‍රතිශතයක් ලෙස ගත් කල එය 179% ක් වේ.

** 14/2019 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව විදේශගත විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමේ කටයුතු සිදු කිරීම හේතුවෙන් වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද 250ක් වන වාර්ෂික විශ්‍රාම වැටුප් සංශෝධන ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2100 දක්වා වැඩිවී ඇත. ප්‍රතිශතයක් ලෙස ගත් කල එය 840% ක් වේ.

- 2019 අයවැය යෝජනා අනුව 2017.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ගනු ලැබූ රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2019.05.31 දිනැති අංක 14/2019 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය, 01/2019 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය හා ඊට අදාලව නිකුත් කරන ලද සංශෝධනයන්ට අනුව විශ්‍රාම වැටුප් විෂමතාවයන් ඉවත් කිරීම සිදු කරන ලදී. ඒ අනුව 2017.01.01 දිනට පෙර විශ්‍රාම වැටුප් හිමිකම ඇති විශ්‍රාමිකයන්ගෙන් 450,358 ක විශ්‍රාම වැටුප් විෂමතා සංශෝධනය කර ඇති අතර ඒ සඳහා රු.5,539,578,593.00 ක මුදලක් වැයවී ඇත.

## 5. මානව සම්පත් පැතිකඩ

### 5.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු (අතිරික්ත) ** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 34 | 26 | 08 |
| තෘතියික | 11 | 05 | 06 |
| ද්විතියික | 1078 | 931 | 147 |
| ප්‍රාථමික | 75 | 71 | 04 |

### 5.2. මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | පුහුණු වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජන (රු ) | | වැඩසටහනේ ස්වභාවය (විදේශීය/ දේශීය) | නිමැවුම්/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ආරක්ෂිත රිය පැදවීම | 2 | 1 | | | | |
| පුරවැසි අවධානය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 2 | 1 | | | | |
| Awareness Programme for the Public Sector Officers | 2 | 1 | | | | |
| ඵලදායීතාවය | 50 | 1 | | | | |
| සේවක අභිප්‍රේරණය | 50 | 1 | | | දේශීය | |
| කාර්යාල ක්‍රම සහ ලිපි සැකසීම | 70 | 1 | | | | |
| ඵලදායීතාවය | 50 | 1 | | | | |
| සේවක අභිප්‍රේරණය | 40 | 1 | | | | |
| කාර්යාල ක්‍රම සහ ලිපි සැකසීම | 42 | 1 | | | | |
| Diploma in Diplomacy & World Affairs 1 Year | 2 | 1 | | | | |
| Masters in Public Administration 1 Year | 1 | 1 | | | | |

## 06. අනුකූලතා වාර්තාව

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1.** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම) | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | | | |
| 1.6 | වෙනත් | | | |
| **2.** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම් (මු.රෙ.445)** | | | |
| 2.1 | රා.ප.ච. 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛනය/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා ලේඛනය (GA – N20 ) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපති විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | * විගණන විමසුම් 31 ක් ලැබී ඇති අතර ඉන් 5ක් සඳහා මේ වන විට පිළිතුරු ලබාදී නොමැත. | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මුදල් රෙගුලාසි 134 (2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම | අනුකූල වේ | | |

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | | *මේ සම්බන්ධව වගකිවයුතු නිලධාරීන් දැනුවත්කර කඩිනමින් පිළිතුරු ලබා ගැනීමට කටයුතු කිරීම |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටුව** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල නොවේ | *නිලධාරියෙකු පත් කර නොමැත | |
| 8.3 | රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | * භාණ්ඩ සමීක්ෂණ පවත්වා ඇත. අදාල වාර්තා යැවීමට කටයුතු කරමින් පවතී | |

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 8.4 | භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ (2018 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ භාණ්ඩ අපහරණය කර අවසන් කර ඇත ) | | |
| **9.** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට ගිණුම්කාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 6කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මුදල් රෙගුලාසි 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | **රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | *වැඩ තහනම් කර ඇති නිලධාරීන් 4 දෙනෙකුගේ, විනය පරීක්ෂණ අවසන් වී නැති දෙදෙනෙකුගේ, ප්‍රමාණවත් තොරතුරු නොමැති දෙදෙනෙකුගේ, සේවය හැරගොස් ඇති නිලධාරියෙකුගේ සහ ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 7 දෙනෙකුගේ හිඟහිටි ණය ශේෂ නිරවුල් කර නැත | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්යය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම | අනුකූල නොවේ | *අර්ධ වාර්ෂික වාර්තාව යවා ඇත | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරිම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥපතියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | * 2020 වර්ෂය සඳහා සකස් කරමින් පවතී | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **20** | **විගණන ජේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ජේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |